JMC vLearning
"your virtual learning partner"

පිරිවැයකරණ ක්‍රම

වරලත් ගණකාධිකරණය - ව්‍යාපාර අදියර II
BL6 - කළමනාකරණ ගිණුම්කරණය (MA)

Pack 02

උපුල් අබේසූරිය
B.Sc. (B.Admin) Sp., FCA, FCMA

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

පරිච්ඡේදය 6

පිරිවැයකරණ ක්‍රම
Cost of Methods

ආයතනයක් නිපදවන භාණ්ඩවලට හෝ සපයන සේවාවලට අදාළ පිරිවැය සෙවීමේ ක්‍රම වේ.

ඕනෑම නිෂ්පාදන ආයතනයකට, එයටම ආවේනික වූ පිරිවැයකරණ ක්‍රමයක් ඇත. නමුත් සමාන ව්‍යාපාරික කටයුතු නැතහොත් කර්මාන්තවල නියැලී සිටින ආයතනවල පිරිවැයකරණ ක්‍රමවල පොදු ලක්ෂණ පවතී.

එසේම, විවිධ වූ කර්මාන්තවල නියැලී සිටින නැතහොත් විවිධ වූ නිෂ්පාදන ක්‍රම භාවිතා කරන ආයතනවල වෙනස් වූ පිරිවැයකරණ ක්‍රම දක්නට ඇත. මෙහිදී සටහන් කරගත යුතු කරුණක් වන්නේ, භාවිතා කරන පිරිවැයකරණ ක්‍රමය කුමක් වුවත්, පිරිවැයකරණයේ මූලික සංකල්පවල වෙනසක් ඇති නොවන බවයි.

භාවිතා කරන සියළුම පිරිවැයකරණ ක්‍රම කොටස් 2 ක් යටතේ වර්ග කල හැක. ඒවානම්,

- විශේෂිත ඇනවුම් පිරිවැයකරණ ක්‍රම
- අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයකරණ ක්‍රම (ඒකීය පිරිවැයකරණය)



පිරිවැයකරණ ක්‍රම

එකක්, අනෙකින් වෙනස්වන පිරිවැය ඒකකයන් නිපදවන නිෂ්පාදන ආයතනවලට වඩාත් සුදුසුවන ක්‍රම ලෙස විශේෂිත ඇනවුම් පිරිවැයකරණ ක්‍රම හැඳින්විය හැක. මේ යටතේ පහත ක්‍රම පිළිබඳව සාකච්ඡා කෙරේ.

- කාර්යය පිරිවැයකරණය
- කාණ්ඩ පිරිවැයකරණය
- කොන්ත්‍රාත්තු පිරිවැයකරණය

එනම් මෙම පිරිවැයකරණ ක්‍රම භාවිතා කරන ආයතන විසින් නිපදවන භාණ්ඩ එකිනෙකට වෙනස් වන අතර, ඒ ඒ භාණ්ඩයටම ආවේනික වූ ලක්ෂණ පවතී.

අනෙක් අතට අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයකරණය (ඇතැම්විට ඒකීය පිරිවැයකරණය ලෙසට ද හඳුන්වන) අදාල වන්නේ එම භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය අඛණ්ඩව යම් මෙහෙයුම් ක්‍රියාවලියක් මගින් සිදුවේ නම් ය. මෙම ක්‍රමයේදී නිශ්චිත පිරිවැය ඒකකයකට සෘජුවම පිරිවැය හඳුනා ගැනීමට නොහැකි අතර, නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා වූ සමස්ථ පිරිවැය හඳුනාගෙන, එය ඒකක ගණනින් බෙදා ඒකකයක සාමාන්‍ය පිරිවැය හඳුනා ගැනේ.

අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයකරණ ක්‍රම පහත පරිදි ප්‍රධාන කොටස් දෙකක් යටතේ බෙදා දැක්විය හැක.

- පෙරසැරි / ක්‍රියාවලී පිරිවැයකරණය (අතුරු නිෂ්පාදන හා බද්ධ නිෂ්පාදන පිරිවැයකරණය ඇතුළුව)
- සේවා පිරිවැයකරණය

කාර්යය පිරිවැයකරණය
JOB COSTING

ගණුදෙණුකරුවෙකුගේ අවශ්‍යතාවයකට අනුව ඉටුකර දීමට බාර ගන්නා කටයුත්තක්, කාර්යයක් ලෙස හැඳින්වේ. **උදාහරණයක් ලෙස, ගණුදෙණුකරුවෙකුගේ අවශ්‍යතාවයකට අනුව කොටස් එකලස් කර පරිගණකයක් සාදා දීම.** එවැනි කාර්යයක පිරිවැය සෙවීමේ ක්‍රමය, "කාර්යය පිරිවැයකරණය" ලෙස හැඳින්වේ. කාර්යය පිරිවැයකරණයේ ප්‍රධාන අරමුණ වන්නේ කාර්යයේ පිරිවැය සෙවීමත් එමගින් ඒ මත වූ ලාභය හෝ අලාභය තීරණය කිරීමත්ය.

කාර්යය පිරිවැය පත්‍රය (Job Cost Card / Sheet)

කාර්යයට අදාල පිරිවැය රැස් කිරීම සඳහා භාවිතා කරන ප්‍රධානම ලියවිල්ල නැතහොත් ආකෘතිය මෙය වේ. ප්‍රායෝගිකව මෙය හුදෙක්ම කාඩ්පතක් හෝ පරිගණකගත ගොනුවක් ද විය හැක. මෙම කාර්යය පිරිවැය පත්‍රය මත, ඒ ඒ කාර්යය හඳුනා ගැනීම සඳහා වූ කාර්යය අංකයක් සඳහන් වේ. කාර්යය කෙරීගෙන යන අතරතුරදී, අදාල කාර්යය වෙනුවෙන් දරන ලද සියළුම පිරිවැය මෙහි ඇතුලත් කෙරේ.

කාර්යය පිරිවැය පත්‍රිකාවක ආදර්ශයක් පහත රූපය මගින් ඉදිරිපත් කර ඇත.

කාර්යය කෙරෙන අතරතුරදී මෙම කාඩ්පත යාවත්කාලීන කල යුතු වේ. පහත සඳහන් අයිතමයන් කාර්යය පිරිවැය පත්‍රිකාවක ඇතුලත් විය යුතුය.

- කාර්යය අංකය
- කාර්යය පිළිබඳ විස්තරය හා පිරිවිතරයන් වැනි
- ගණුදෙණුකරු පිළිබඳ විස්තර
- ඇස්තමේන්තුගත පිරිවැය
- සත්‍ය පිරිවැය
- භාරගත් දිනය / ආරම්භ කල දිනය / භාරදීමට නියමිත දිනය
- සත්‍ය වශයෙන්ම භාරදුන් දිනය
- මිල හා ඇස්තමේන්තුගත ලාභය .... වැනි.

කාර්යය පිරිවැය පත්‍රිකාව

කාර්යය අංකඃ 1010

ගණුදෙණුකරුගේ විස්තරඃ

සමන් පෙරේරා මහතා
පහල බියන්විල
කඩවත.
ජංගම දු.ක. : 0772 - xxxxxx
ඊ මේල් : sperera@gmail.com

කාර්යය විස්තරයඃ

පූර්ණ සේවාකරණය
ටොයොටා කාර් - WP KM 6875

දිනය

භාරගත් : 08/08/2015
පටන්ගත් : 10/08/2015
භාරදිය යුතු : 12/08/2015

ද්‍රව්‍ය					ශ්‍රමය					නිෂ්පාදන පොදුකාර්ය		
දිනය	MRN අංකය	ප්‍රමාණය	මිල රු.	වටිනාකම රු.	දිනය	සේවක අංකය	පැය	රේටය රු.	වටිනාකම රු.	පැය	අන්තර්. අනුපාතය	රු.
10/08	330	ළී. 2	300	600	23/10	15	5	50	250	8	120	960
11/08	332	ක. 2	50	100	23/10	11	2	100	200			
					24/10	02	1	250	250			
එකතුව				700	එකතුව				700	එකතුව		960

වියදම්	
විස්තරය	රු.
	_
	_

කාර්යය පිරිවැය සාරාංශය		
පිරිවැය මූලිකාංගය	සත්‍ය රු.	ඇස්තමේන්තුව රු.
සෘජු ද්‍රව්‍ය	700	800
සෘජු ශ්‍රමය	700	600
සෘජු වියදම්	-	-
මුළු සෘජු පිරිවැය	1,400	1,400
නිෂ්පාදන පොදුකාර්ය	960	680
නිෂ්පාදන පිරිවැය	2,360	2,080
පරිපාලන පොදුකාර්ය (5%)	118	104
මුළු පිරිවැය	2,478	2,184
ඇස්තමේන්තුගත මිල	2,800	2,800
කාර්යය මත ලාභය/(පාඩුව)	322	616

------------------------------ ------------------------------ --------------
කාඩ්පත පිලියෙල කලේ අනුමත කලේ දිනය

JOB COST SHEET

Job No: 1010

Customer details:

Mr. Saman Perera

Pahala Biyanwila

Kadawatha

Mobile : 0772 – xxxxxx

Email : sperera@gmail.com

Job description:

Full service

Toyota Car – WP KM 6875

Date

Under taken : 08/08/2015

Started : 10/08/2015

To be handed over : 12/08/2015

Materials					Labour					Production Overheads		
Date	Reqn. No.	Qty.	Price Rs.	Value Rs.	Date	Emp. No.	Hrs.	Rate Rs.	Value Rs.	Hours	O/H Ab. Rate	Rs.
10/08	330	2 Lts	300	600	23/10	15	5	50	250	8	120	960
11/08	332	2 Kg	50	100	23/10	11	2	100	200			
					24/10	02	1	250	250			
Total				700	Total				700	Total		960

Expenses	
Description	Rs.
	–
	–

JOB COST SUMMARY		
Cost Element	Actual Rs.	Estimate Rs.
Direct Material	700	800
Direct Labour	700	600
Direct Expenses	-	-
Total Direct Cost	1,400	1,400
Production O/H	960	680
Production Cost	2,360	2,080
Admin. O/H (5%)	118	104
Total Cost	2,478	2,184
Price Estimate	2,800	2,800
Profit/(Loss) on the Job	322	616

----------------------------- ----------------------------- --------------

Job card completed by Authorized by Date

කාර්යය පිරිවැයකරණ ක්‍රියාවලිය (Job Costing Procedure)

කාර්යය පිරිවැයරණයේ ප්‍රධානම පරමාර්ථය වන්නේ කාර්යය වෙනුවෙන් දැරූ සියළුම පිරිවැය, කාර්යයට අය කිරීමය. මේ සඳහා උපකාරී වන්නේ කාර්යය පිරිවැය පත්‍රිකාවයි. කාර්යය වෙනුවෙන් දැරූ සියළුම පිරිවැය, කාර්යය පිරිවැය පත්‍රිකාව තුල අඩංගු වේ.

උදාහරණ : 01

සීමිත JK ලංකා සමාගම ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන්ට අනුව ගොඩනැගිලි ඉදිකිරීමේ උපකරණ නිෂ්පාදනයේ යෙදී සිටී. සම්පූර්ණ නිෂ්පාදන ක්‍රියාවලිය පිරිවැය මධ්‍යස්ථාන 03 කට වෙන්කර ඇත. ඒවා A, B හා C වේ. ඉදිරි වර්ෂය සඳහා සමාගම විසින් පිළියෙල කර ඇති අයවැය ලේඛනයෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

පිරිවැය මධ්‍යස්ථානය	අයවැයගත නිෂ්පාදන පොදුකාර්ය	අයවැයගත පැය
A	රු. 38,500	22,000 (යන්ත්‍ර පැය)
B	රු. 75,088	19,760 (යන්ත්‍ර පැය)
C	රු. 40,964	41,800 (ශ්‍රම පැය)

කාර්යය අංක 427, කාලය තුළදී නිමකිරීමට හැකි වූ අතර ඊට අදාළ කාර්යය පිරිවැය පත්‍රිකාව මගින් පහත පිරිවැය තොරතුරු උපුටා ගෙන ඇත.

ඍජු අමුද්‍රව්‍ය (නිකුත් කළ)	රු. 6,780.10
ඍජු අමුද්‍රව්‍ය (නැවත ගබඩාවට එවූ)	රු. 39.60

<u>ඍජු ශ්‍රමය</u>

පිරිවැය මධ්‍යස්ථාන A	පැය 146 ක්, පැයක් රු. 4.80 බැගින්
පිරිවැය මධ්‍යස්ථාන B	පැය 39 ක්, පැයක් රු. 5.70 බැගින්
පිරිවැය මධ්‍යස්ථාන C	පැය 279 ක්, පැයක් රු. 6.10 බැගින්

කුළී පිරිවැය රු. 590 ක් වූ විශේෂිත යන්ත්‍රයක් මේ සඳහා කුලියට ලබාගෙන ඇත.

කාර්යය අංක 427 ට අදාළව වාර්තා වූ යන්ත්‍ර පැය ගණන් පහත පරිදි විය.

පිරිවැය මධ්‍යස්ථානය A	පැය 411
පිරිවැය මධ්‍යස්ථානය B	පැය 657

කාර්යය වෙනුවෙන් ගණුදෙනුකරුට ඉදිරිපත් කළ හා අයකළ ගාස්තුව රු. 17,200 කි.

කාර්යය පිරිවැයකරණය සඳහා JK ලංකා සමාගම නිෂ්පාදන නොවන පොදුකාර්ය පහත පරිදි අයකරනු ලැබේ.

පරිපාලන හා අනෙකුත් වියදම්	- නිෂ්පාදන පිරිවැයෙන් 10% ක්
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	- විකුණුම් මිලෙන් 12% ක්

කාර්යය අංක 427 ට අදාළව කාර්යය පිරිවැය විශ්ලේෂණය හා ඊට අදාළ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

පිළිතුර :

පෙරවැඩ:

පූර්ව නිශ්චිත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාතිකයන්

පිරිවැය මධ්‍යස්ථාන - A

යන්ත්‍ර පැයක අන්තර්ග්‍රහනය $= \frac{38,500}{22,000} = 1.75$

පිරිවැය මධ්‍යස්ථාන - B

යන්ත්‍ර පැයක අන්තර්ග්‍රහනය $= \frac{75,088}{19,760} = 3.80$

පිරිවැය මධ්‍යස්ථාන - C

ශ්‍රම පැයක අන්තර්ග්‍රහනය $= \frac{40,964}{41,800} = 0.98$

කාර්යය අංක 427 ට අදාළ
පිරිවැය හා ලාභ විශ්ලේෂණය

			රු.
සෘජු අමුද්‍රව්‍ය			6,740.50
සෘජු ශ්‍රමය			
A	146 x 4.80	700.80	
B	39 x 5.70	222.30	
C	279 x 6.10	1,701.90	2,625.00
සෘජු අනෙකුත් වියදම් - විශේෂිත යන්ත්‍ර කුලී			590.00
ප්‍රාථමික පිරිවැය / මුළු සෘජු පිරිවැය / වි.නි.පි.			9,955.50
නිෂ්පාදන පොදුකාර්ය			
A	411 x 1.75	719.25	
B	657 x 3.80	2,496.60	
C	279 x 0.98	273.42	3,489.27
මුළු නිෂ්පාදන පිරිවැය / කම්හල් පිරිවැය			13,444.77
පරිපාලන හා අනෙකුත් වියදම් (13,444.77 x 10%)			1,344.48
විකුණුම් හා බෙදාහැරීමේ වියදම් (17,200 x 12%)			2,064.00
මුළු පිරිවැය			16,853.25
ලාභය			346.75
විකුණුම් මිල			17,200.00

කාර්යය පිරිවැයකරණය සඳහා ගිණුම් තැබීම (Accounting for Job Costing)

"පිරිවැය ගිණුම් තැබීම" යටතේ සාකච්ඡා කළ පරිදි ප්‍රායෝගිකව බහුලව භාවිතාවන පිරිවැය ගිණුම් තැබීමේ ක්‍රමය වන්නේ සංකලිත (Integrated System) ක්‍රමයයි.

මෙහිදී භාවිතාවන ලෙජර් ගිණුම්

1) ඒ ඒ කාර්යය සඳහා ලෙජර් ගිණුම් (කාර්යයේ නමින් නම් කෙරේ)
2) කෙරීගෙන යන වැඩ පාලන (කාර්යය සියල්ලම සඳහා පොදු)
3) අමුද්‍රව්‍ය තොග පාලන ගිණුම
4) වැටුප් පාලන ගිණුම
5) නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය පාලන ගිණුම
6) නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය පාලන ගිණුම
7) අධි / ඌණ නිෂ්පාදන පොදුකාර්ය අන්තර්ග්‍රහන ගිණුම

උදාහරණ : 02

කේ.එල්.සී. සමාගම කාර්යය පිරිවැයකරණ ක්‍රමය භාවිතයෙන් පිරිවැයකරණය කරයි. ගණුදෙනුකරුවන්ගේ කාර්යයන් සමාගමේ පරිශ්‍රයේදීම ඉටුකරන අතර කාර්යය අවසන් වූ වහාම ගණුදෙනුකරුට භාරදීම කරයි.

සමාගම සෘජු ශ්‍රමිකයන්ට පැයකට රු. 10 බැගින් ගෙවීම් කරන අතර පිරිවැයකරණය සඳහා ශ්‍රම පැයකට රු. 24 බැගින් පූර්ව නිශ්චිත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාතිකයක් භාවිතා කරයි. කාර්යයක් අවසන් වූ වහාම නිෂ්පාදන නොවන පොදුකාර්යය පිරිවැය ප්‍රමාණය ලාභය ගණනය කිරීම සඳහා ලාභාලාභ ගිණුමට අයකෙරේ.

2010.12.31 අවසන් වර්ෂය සඳහා අදාළ කාර්යයන් තුනක් පිළිබඳ වූ තොරතුරු පහත දී ඇත.

1) කාර්යය අංක 308, 2010/01/01 කෙරීගෙන යන වැඩ ලෙස පැවතුනි. එම කාර්යය සඳහා වූ 2009/12/31 දිනට වන තෙක් දරා ඇති පිරිවැය පහත පරිදි විය.

	රු.
සෘජු අමුද්‍රව්‍ය	17,900
සෘජු ශ්‍රමය	9,600
නිෂ්පාදන පොදුකාර්යය	23,040
නිෂ්පාදන පිරිවැය	50,540

වර්ෂය තුළදී කාර්යය අංක 309 සහ 310 ආරම්භ කරන ලද අතර, වර්ෂය අවසාන වන විට කාර්යය අංක 308 හා 309 අවසන් කිරීමට සමාගමට හැකිවිය.

ඉහත කාර්යයන් 03 ට අදාළ වර්ෂය සඳහා වූ පිරිවැය හා අනෙකුත් තොරතුරු පහත වේ.

කාර්යය අංක →	308	309	310
නිකුත් කළ සෘජු ද්‍රව්‍ය	1,690	21,530	4,520
ගබඩාවට නැවත හරවා එවූ සෘජු ද්‍රව්‍ය	-	230	-
සෘජු ශ්‍රම පැය (වැඩකළ)	820	530	280
වර්ෂය අවසාන දිනට තත්ත්වය	නිමි	නිමි	නොනිමි
විකුණුම් / ඉන්වොයිසි වටිනාකම	99,000	68,700	-

වර්ෂය තුළදී රු. 430 ක් වටිනා ඍජු ද්‍රව්‍ය, කාර්යය අංක 309 න්, 310 සඳහා මාරුකර ඇත.

කාලය තුළදී දරන ලද ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය හා නිෂ්පාදන නොවන ස්ථාවර පොදු කාර්යය පිරිවැය පිළිවෙලින් රු. 45,900 ක් හා රු. 13,120 ක් විය.

පහත සඳහන් දෑ ඔබගෙන් බලාපොරොත්තු වේ.

a) සියලුම ලෙජර ගිණුම්

b) නිමකළ කාර්යයන් වලට අදාළ ලාභයන්

පිළිතුර :

කාර්යය 308

1/1 ඉ/ගෙ	50,540	විකුණුම් පිරිවැය පාලන	80,110
අමු.තොග.පාලන	1,690		
වැටුප් පාලන (820 x 10/=)	8,200		
නි.පො.කා.පිරිවැය (820 x 24/=)	19,680		
	80,110		80,110

කාර්යය 309

1/1 ඉ/ගෙ	-	අමු.තොග පාලන (හරවා යැවූ)	230
අමු.තොග.පාලන	21,530	මාරුකිරීම් - කාර්යය 310 ට	430
වැටුප් පාලන (530 x 10/=)	5,300	විකුණුම් පිරිවැය පාලන	38,890
නි.පො.කා.පිරිවැය (530 x 24/=)	12,720		
	39,550		39,550

කාර්යය 310

1/1 ඉ/ගෙ	-		
අමු.තොග.පාලන	4,520		
වැටුප් පාලන (280 x 10/=)	2,800		
නි.පො.කා.පිරිවැය (280 x 24/=)	6,720	ප/ගෙ	14,470
මාරුකිරීම් - කාර්යය 309 න්	430		
	14,470		14,470

කෙරීගෙන යන වැඩ පාලන ගිණුම

1/1 ඉ/ගෙ	50,540	අමු.තොග පාලන	230
අමු.තොග.පාලන	27,740	විකුණුම් පිරිවැය පාලන	119,000
වැටුප් පාලන (1630 x 10/=)	16,300	ප/ගෙ	14,470
නි.පො.කා.පිරිවැය	39,120		
	133,700		133,700

නි.පො.කා. පිරිවැය පාලන ගිණුම

වියදම් ණයහිමියෝ	45,900	අන්තර්ග්‍රහනය - කාර්යය 308	19,680
		අන්තර්ග්‍රහනය - කාර්යය 309	12,720
		අන්තර්ග්‍රහනය - කාර්යය 310	6,720
		ඌණ අන්තර්ග්‍රහනය	6,780
	45,900		45,900

නිෂ්පාදන නොවන පො.කා. පිරිවැය පාලන ගිණුම

වියදම් ණයහිමියෝ	13,120	ලා/ලා ගිණුම	13,120
	13,120		13,120

නි.පො.කා. ඌණ / අධි අන්තර්ග්‍රහන පාලන ගිණුම

නි.පො.කා. පිරිවැය පාලන	6,780	ලා/ලා ගිණුම	6,780
	6,780		6,780

ලාභාලාභ ගිණුම

විකුණුම් පිරිවැය පාලන	119,000	විකුණුම් (99,000 + 68,700)	167,700
නිෂ්.නොවන පො.කා.පාලන	13,120		
ඌණ නි.පො.කා. අන්තර්ග්‍රහනය	6,780		
කාලය සඳහා ලාභය	28,800		
	167,700		167,700

විකුණුම් පිරිවැය පාලන ගිණුම

කාර්ය අංක 308	80,110	ලා/ලා ගිණුම	119,000
කාර්ය අංක 309	38,890		
	119,000		119,000

කාණ්ඩ පිරිවැයකරණය
BATCH COSTING

විශේෂිත ඇනවුම් පිරිවැයකරණය යටතට ගැනෙන තවත් පිරිවැයකරණ ක්‍රමයක් වන්නේ කාර්යය පිරිවැය කාරණයයි. එක සමාන ලක්ෂණ ඇති අයිතම් රාශියක එකතුවක්, කාණ්ඩයක් ලෙස නිර්වචනය කළ හැකි අතර එය, කාර්යයකට බොහෝ සෙයින් සමාන වන අතර පිරිවැය ඒකකය වන්නේ සමස්ථ කාණ්ඩයයි. කාණ්ඩය තුළ ඇති එක් අයිතමයක පිරිවැය සෙවීමට අවශ්‍යවන්නේ නම්, කාණ්ඩයේ මුළු පිරිවැය, අයිතම් ගණනින් බෙදිය යුතුය.

උදාහරණ : 03

ආයතනයක් ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන්ට අනුව පාසල් සපත්තු නිෂ්පාදනයේ යෙදී සිටින අතර පහත සඳහන් අයවැයගත පොදුකාර්ය දත්ත වර්ෂය සඳහා අදාළ වේ.

දෙපාර්තමේන්තුව	අයවැයගත නි.පො.කා.	අයවැයගත ක්‍රියාකාරකම්
කැපීම්	රු. 120,000	යන්ත්‍ර පැය 6,000
ඇලවීම්	රු. 200,000	ශ්‍රම පැය 5,000
නිමකිරීම්	රු. 150,000	ශ්‍රම පැය 15,000

නිෂ්පාදන පිරිවැයට 20% ක් වූ අනුපාතයක් මත, නිෂ්පාදනය නොවන පොදුකාර්ය අන්තර්ග්‍රහණය කළ යුතුය. ස්වරූපයෙන් සමාන සපත්තු කුට්ටම් 200 ක් සැපයීමට, සමාගමට ඇනවුමක් ලැබී ඇත.

මෙම කාණ්ඩය සඳහා ලබාදී ඇති අනුක්‍රමික කාණ්ඩ අංකය 3006 වේ. පහත දී ඇති පිරිවැය මෙම කාණ්ඩ 3006 වෙනුවෙන් සමාගම දරා ඇත.

අමුද්‍රව්‍ය රු. 80,000

කාණ්ඩය වෙනුවෙන් ගත කළ සත්‍ය කාලය :

- කැපීම් දෙපාර්තමේන්තුව - යන්ත්‍ර පැය 2,000
- ඇලවීම් දෙපාර්තමේන්තුව - ශ්‍රම පැය 750
- නිමකිරීම් දෙපාර්තමේන්තුව - ශ්‍රම පැය 1,000

රු. 42,000 ක පිරිවැයක් දරා, මෙම ඇනවුම සඳහා විශේෂ වූ සවිකිරීම් යන්ත්‍රයක් කුලියට ලබාගෙන ඇත.

සෘජු ශ්‍රම වැටුප් අනුපාතයන් :

- ඇලවීම් දෙපාර්තමේන්තුව - පැයකට රු. 40
- නිමකිරීම් දෙපාර්තමේන්තුව - පැයකට රු. 20

සෑම ඇනවුමකම විකුණුම් මිල මත 20% ක ලාභාන්තිකයක් තබාගැනීම, සමාගමේ මිල කිරීමේ ප්‍රතිපත්තිය වේ.

එක් සපත්තු කුට්ටමක පිරිවැය හා විකුණුම් මිල ගණනය කරන්න.

පිළිතුර :

පෙරවැඩ :

පියවර 01
නිෂ්පාදන පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතිකය ගණනය කිරීම.

- කැපීම් අංශය :

  යන්ත්‍ර පැයකට පො/කා අන්තර්ග්‍රහණ අනුපාතය $= \frac{120,000}{6,000}$

  $=$ රු. 20

- ඇලවීම් අංශය :

  ශ්‍රම පැයකට පො/කා අන්තර්ග්‍රහණ අනුපාතය $= \frac{200,000}{5,000}$

  $=$ රු. 40

- නිමකිරීම් අංශය :

  ශ්‍රම පැයකට පො/කා අන්තර්ග්‍රහණ අනුපාතය $= \frac{150,000}{15,000}$

  $=$ රු. 10

		රු.	රු.
	සෘජු ද්‍රව්‍ය		80,000
(+)	සෘජු ශ්‍රමය :		
	ඇලවීම් අංශය (රු. 40@750)	30,000	
	නිමකිරීම් අංශය (රු. 20@1000)	20,000	50,000
(+)	සෘජු වියදම් : (කුලියට ගත් යන්ත්‍රය)		42,000
	මුළු සෘජු පිරිවැය / ප්‍රාථමික පිරිවැය		172,000
(+)	ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය :		
	කැපීම් අංශය (රු. 20 x 2000)	40,000	
	ඇලවීම් අංශය (රු. 40 x 750)	30,000	
	නිමකිරීම් අංශය (රු. 10 x 1000)	10,000	80,000
	කම්හල් පිරිවැය / මුළු නිෂ්පාදන පිරිවැය		252,000
(+)	නිෂ්පාදන නොවන පොදු කාර්ය (252,000 x 20%)		50,400
	කාණ්ඩයට අදාළ මුළු පිරිවැය		302,400

එමනිසා, ඒකකයක මුළු පිරිවැය (එක් සපත්තු කුට්ටමක) $=$ රු. $\frac{302,400}{200}$

$=$ රු. 1,512

විකුණුම් මිල :		රු.
එක් කුට්ටමක මුළු පිරිවැය	=	1,512
(+) ලාභය $\left(1,512 \times \frac{20}{80}\right)$	=	378
∴ විකුණුම් මිල	=	1,890

කොන්ත්‍රාත් පිරිවැයකරණය

CONTRACT COSTING

විශේෂිත ඇනවුම් පිරිවැයකරණයට අයත් තවත් පිරිවැයකරණ ක්‍රමයක් ලෙස මෙය දැක්විය හැක. මෙම ක්‍රමය බොහෝවිට කාර්යය පිරිවැයකරණයට සමාන වේ. මෙයද කාර්යය පිරිවැයකරණයටම අදාළ එක් ස්වරූපයක් වන අතර, වෙනස්වනුයේ ප්‍රමාණය (Size) සහ නිමකිරීමට ගත වන කාලය යන කරුණු දෙක මත පමණි. කොන්ත්‍රාත්තුවක් ප්‍රමාණය අනුව විශාල වන අතර, කාලය අනුව ගත්විට දිගු වේ. නැව් නිෂ්පාදනය, අධිවේගී මාර්ග තැනීම, ගොඩනැගිලි ඉදිකිරීම හා ඒ හා සමාන දිගුකාලීන ස්වරූපයේ වැඩ සඳහා කොන්ත්‍රාත් පිරිවැයකරණය භාවිතා කළ හැක.

පහත දී ඇති දෑ කොන්ත්‍රාත් පිරිවැයකරණයට අදාළ විශේෂ ලක්ෂණ වේ.

(1) එහි ගණුදෙනුකරුගේ අවශ්‍යතාවයට (පිරිවිතරයන්ට) අනුව ඉටුකර දීමට කොන්ත්‍රාත්තුවක් භාර ගැනේ.

(2) නිම කිරීම සඳහා සාපේක්ෂව දිගු කාලයක් ගත වේ. (ඇතැම්විට එක් ගිණුම් වර්ෂයකට වඩා වැඩි කාලයක් වුවද ගතවිය හැක.)

(3) ඒවා වැඩබිම් සංකල්පය මත පදනම් වේ. එනම් අදාල වැඩ ගණුදෙනුකරුගේ ස්ථානයේදී/වැඩබිමේදී ඉටු වේ.

(4) ද්‍රව්‍ය මිලදීගෙන සෘජුවම වැඩබිමට බෙදාහැරීම සිදු වේ. ඇතැම්විට මධ්‍යම ගබඩාවෙන් ලබා ගැනේ.

(5) හැමවිටම වැඩබිමට අදාල වෙනම වැටුප් ලේඛනයක් පවත්වා ගැනේ.

(6) වැඩ බොහෝවිට ඉදිකිරීම් ස්වරූපය ගනී.

(7) කොන්ත්‍රාත්තුවට අදාල කොටසක් හෝ කොටස් කීපයක් උපකොන්ත්‍රාත්කරුවන්ට ලබා දේ. නිදසුනක් ලෙස, ගොඩනැගිලි ඉදිකිරීමකදී ටයිල් කිරීම, පින්තාරු කිරීම .... වැනි කටයුතු.

(8) කොන්ත්‍රාත්තුවට අදාල කාලය සඳහා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම හෝ කුලියට ගැනීම සිදු වේ.

(9) කල වැඩ මත, ගණුදෙනුකරු විසින් පියවරෙන් පියවර ගෙවීම් කරයි. (එනම් ප්‍රගති ගෙවීම්)

(10) කොන්ත්‍රාත්තු ගිවිසුමේ එකඟ වී ඇති ආකාරයට, සෑම ප්‍රගති ගෙවීමකින්ම යම් ප්‍රතිශතයක් ගණුදෙණුකරු රඳවා ගනී. (එනම් රඳවාගත් මුදල්)

(11) කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමට පෙර, එහි මිල ඇස්තමේන්තු කර ඒ සඳහා දෙපාර්ශවයම එකඟ වේ. (ගණුදෙනුකරු හා කොන්ත්‍රාත්තුකරු)

(12) සෑම කොන්ත්‍රාත්තුවක්ම, එකක් අනෙකින් වෙනස්වන නිසා, යම් කොන්ත්‍රාත්තුවකට අදාලව සියළුම වියදම්, එම කොන්ත්‍රාත්තුවට පමණක් අය කෙරේ. සාමාන්‍යයෙන් වක්‍ර වියදම් ලෙස සලකනු ලබන විදුලි වියදම්, දුරකතන බිල්, සුපරීක්ෂක වේතන මෙහිදී සෘජු වියදම් ලෙස ගැනේ.

(13) කොන්ත්‍රාත්තුවක් නිම කිරීමට දීර්ඝ කාලයක් ගතවන හෙයින්, කොන්ත්‍රාත්තුවකට අදාල ආදායම් හා වියදම් ගිණුම් කාලපරිච්ඡේද දෙකකට සම්බන්ධ විය හැක.

ප්‍රගති ගෙවීම් (Progress Payments)

කොන්ත්‍රාත්තුවට අදාල වැඩ කරගෙන යන අතරතුරදී එම නිමකල වැඩ ප්‍රමාණය මත, ගණුදෙනුකරු විසින් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීම සාමාන්‍යයෙන් සිදු වේ. මෙම අතුරු ගෙවීම්, ''ප්‍රගති ගෙවීම්''ලෙස හැඳින්වේ. නිදසුන් ලෙස ගොඩනැගිලි ඉදිකිරීමකදී, ගොඩනැගිල්ලට අදාල අඩිතාලම නිම වූ විටදී, පලමු මහල නිම වූ විටදී .... ලෙස ගෙවීම් කිරීම දැක්විය හැක. (ඇතැම් අවස්ථාවලදී මෙම ප්‍රගති ගෙවීම් කරනු ලබන්නේ නිශ්චිත කාල පරාසවලදීය.)

ප්‍රායෝගිකව, මෙම ප්‍රගති ගෙවීම ඉල්ලා සිටීමට, ඒ සඳහා වූ අතුරු ඉන්වොයිසියක් (Interim invoice / Bill) පිළියෙල කෙරේ. කොන්ත්‍රාත්කරු විසින්, ගණුදෙනුකරුට මෙම ඉන්වොයිසි ඉදිරිපත් කල යුත්තේ

"ගෘහ නිර්මාණ ශිල්පියාගේ සහතිකය" සමඟ වේ. (මෙය මිනුම්කරුගේ සහතිකය නැතහොත් ඉදිකිරීම් උපදේශකගේ සහතිකය ලෙසටද හැඳින්වේ.) මේ සඳහා ගණුදෙනුකරු නම් කරන ගෘහ නිර්මාණ ශිල්පියා නැතහොත් මිනුම්කරු, විවිධ අදියර වලදී වැඩ බිමට ගොස් නිරීක්ෂණය කල යුතුය. එලෙස නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව, ඒ දක්වා නිමකල ඇති වැඩවල වටිනාකම (පිරිවැය නොවේ) සඳහන් කරමින් සහතිකයක් නිකුත් කෙරේ. මෙම සහතිකය, ඉන්වොයිසියට අමුණා ගණුදෙනුකරුට ඉදිරිපත් කල යුතුය.

රඳවාගත් මුදල් (Retention Money)

ප්‍රගති ගෙවීම් කරන විට, එයින් යම් ප්‍රතිශතයක් තබාගෙන ගෙවීම් කිරීම සඳහා, ගණුදෙනුකරුවෙකුට ඕනෑම ගිවිසුමකින් ප්‍රතිපාදන සැලසේ. එලෙස තබාගන්නා මුදල, "රඳවාගත් මුදල්" ලෙස හැඳින්වේ. මෙම රඳවාගන්නා මුදල ගණුදෙනුකරුවෙකුට තබාගත හැක්කේ ගිවිසුම තුළ එකඟ වූ නිශ්චිත කාලසීමාවක් අවසන් වන තුරු පමණි.

ඒ ඒ ගිවිසුම් වල නියමයන් අනුව මෙම ප්‍රතිශතය වෙනස් වන අතර, සාමාන්‍යයෙන් එය ඉන්වොයිසිය මගින් ඉල්ලා සිටින වටිනාකමෙන් 10% කි. ඉහතින් සඳහන් කළ එකඟ වූ කාලපරිච්ඡේදය තුළ, කොන්ත්‍රාත්කරුගේ දෝෂයන් හේතුවෙන් ගණුදෙනුකරුට දැරීමට වන අලාභ ආවරණය කරගැනීම සඳහා මෙම මුදල් රඳවා ගැනේ.

ප්‍රගති ගෙවීම පහත පරිදි ගණනය කෙරේ.

කළ හා සහතික කළ වැඩවල වටිනාකම		XXX
(-)	රඳවාගත් මුදල් (10%)	(XX)
		XXX
(-)	මේ දක්වා කළ ගෙවීම්	(XX)
මෙම ඉන්වොයිසිය මත කළ යුතු ගෙවීම		XXX

උදාහරණ : 01

	රු.
සහතික කළ වැඩවල වටිනාකම	6,000,000
(-) රඳවා ගන්නා මුදල (10%)	600,000
	5,400,000
(-) කලින් කළ ගෙවීම් වල එකතුව	4,500,000
මෙම ඉන්වොයිසිය මත කළ යුතු ගෙවීම	900,000

කොන්ත්‍රාත්තු සඳහා ගිණුම් තැබීම (Accounting for Contracts)

කොන්ත්‍රාත්තු සඳහා ගිණුම් තැබීම කළ යුත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ට (LKAS 11) අනුවයි. මෙම ගිණුම්කරණ ප්‍රමිතය මගින් අවධානය යොමු කරනුයේ, කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ප්‍රකාශන තුළ, ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට සම්බන්ධ ආදායම් හා පිරිවැය වල බලපෑම පිළිබඳවයි. කෙසේ වුවත්, ගණුදෙනුකරු (සමාගමක් නම් හෝ ගිණුම්කරණ ඒකකයක් නම්) ගිණුම් තැබිය යුත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව වේ. (LKAS-16, 'Property, plant and equipment.')

සෘජු ද්‍රව්‍ය (Direct Material)

කොන්ත්‍රාත්තුවට භාවිතා කරන සෘජු ද්‍රව්‍ය, සමාගමේ මධ්‍යම ගබඩාවෙන් හෝ සෘජුවම සැපයුම්කරුගෙන් ලබාගත හැක. ක්‍රමය කුමක් වුවත්, වැඩබිම වෙත යැවූ සෘජු ද්‍රව්‍ය වල වටිනාකම කොන්ත්‍රාත් ගිණුමට හර කළ යුතුය. යම් හෙයකින් එම ද්‍රව්‍ය නැවතත් ගබඩාවට හෝ සැපයුම්කරුට හරවා යැවීම කළේ නම්, එම වටිනාකම කොන්ත්‍රාත් ගිණුමට බැර කළ යුතුවේ. කාලපරිච්ඡේදය අග දිනට, නිම නොකළ කොන්ත්‍රාත්තු වලට අදාළව වැඩබිම තුළ ඉතිරි වන ද්‍රව්‍ය වල වටිනාකම, කොන්ත්‍රාත්තු ගිණුමෙන් ශේෂයක් ලෙස (බැර) පහළට ගෙන යා යුතු අතර ඊළඟ කාලපරිච්ඡේදයේදී එම වටිනාකම ආරම්භක ශේෂයක් ලෙස ඉදිරියට (හර) ගෙන ආ යුතුය.

සෘජු ශ්‍රමය (Direct Labour)

සාමාන්‍යයෙන් කොන්ත්‍රාත්තු වැඩබිම් වල ශ්‍රමය සඳහා ගෙවීම් කරනුයේ පැය හෝ දෛනික පදනම මත වේ. ඉටුකරන සෑම කාර්යයක්ම තනි කොන්ත්‍රාත්තුවක් සඳහා නිසා, කොන්ත්‍රාත්තුවට අදාළ ශ්‍රම පිරිවැය වැඩබිමේ ඇති වැටුප් ලේඛනය මගින් පහසුවෙන් හඳුනාගත හැක. එලෙස හඳුනාගන්නා සෘජු ශ්‍රම පිරිවැය, කොන්ත්‍රාත්තුවට අදාළ මුළු පිරිවැය හඳුනාගැනීම සඳහා කොන්ත්‍රාත්තු ගිණුමට හර කළ යුතුය.

අධීක්ෂණ පිරිවැය (Cost of Supervision)

කාර්යය පිරිවැයකරණය, කාණ්ඩ පිරිවැයකරණය, පෙරසැරි පිරිවැයකරණය වැනි පිරිවැයකරණ ක්‍රම වලදී අධීක්ෂණ පිරිවැය, සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයක් ලෙසයි. නමුත් කොන්ත්‍රාත්තු පිරිවැයකරණයේදී, අධීක්ෂණ පිරිවැය සෘජු පිරිවැයක් ලෙස සලකන අතර කොන්ත්‍රාත් ගිණුමට හර කෙරේ.

උප කොන්ත්‍රාත්කරුවන්ට කරන ගෙවීම් (Payments made to Sub-contractors)

ප්‍රධාන කොන්ත්‍රාත්තුවට සම්බන්ධ යම් විශේෂ කාර්යයක් සඳහා උප කොන්ත්‍රාත්කරුවෙකු යොදවා ඇතිවිට, එම උප කොන්ත්‍රාත්කරු විසින් ඉටුකරනු ලබන කාර්යය, ප්‍රධාන කොන්ත්‍රාත්කරුට සෘජුවම අයකළ යුතුය. මහා පරිමාණ කොන්ත්‍රාත්තු වල බොහෝ කාර්යයන්, උප කොන්ත්‍රාත්කරුවන් මගින් සිදුවේ. මෙලෙස උප කොන්ත්‍රාත්කරුවන්ට කරන ගෙවීම් එකතුවක් ලෙස ගෙන, සෘජු වියදමක් ලෙස සලකා කොන්ත්‍රාත් ගිණුමට අයකළ යුතු අතර පිරිවැයකරණය සඳහා ඒවායේ විස්තරාත්මක වාර්තා අවශ්‍ය නොවේ.

කොන්ත්‍රාත්තුව සඳහා භාවිත කළ යන්ත්‍රෝපකරණ (Plants used on the Contract)

විවිධාකාරයේ බර - යන්ත්‍රෝපකරණ කොන්ත්‍රාත්තු සඳහා භාවිත වේ. නිදසුන් ලෙස එසවීම් උපකරණ (cranes), සිමෙන්ති මිශ්‍රකරන යන්ත්‍ර, බුල්ඩෝසර, කැටපිලර් යන්ත්‍ර...... වැනි. ඒවා සමාගමට අයත් නැතහොත් කුලියට ගත් ඒවා විය හැක.

එම යන්ත්‍ර කුලියට ගත් ඒවා නම්, එම කුලී පිරිවැය සෘජු වියදමක් ලෙස සලකන අතර කොන්ත්‍රාත් ගිණුමට හර කළ යුතුය.

එම යන්ත්‍ර සමාගමට අයත් ඒවා නම්, තත්වය වෙනස් වන අතර ඒ ඒ අවස්ථාව අනුව තීරණය වේ. ප්‍රායෝගිකව, යන්ත්‍ර අවශ්‍යවන විට එක් වැඩබිමක සිට තවත් වැඩිබිමකට ඒවා මාරු කෙරේ. මෙහිදී ඒවායේ භාවිතය මත ඒ ඒ කොන්ත්‍රාත්තුවට ක්ෂය ලෙස සාධාරණ වටිනාකමක් අයකිරීම තහවුරු කිරීමට, එම මාරුකිරීම් ප්‍රවේශමෙන් හා නිවැරදිව ලේඛනගත කළ යුතුය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා පොදුවේ භාවිත කරන ක්‍රම කීපයකි.

ක්‍රමය (1) : ගණනය කළ ක්ෂය ප්‍රමාණයක් අය කිරීම

මෙහිදී භාවිත කළ යන්ත්‍ර සඳහා සරල මාර්ග, හීනවන ශේෂ හෝ වෙනත් ක්‍රමයක් භාවිත කර ක්ෂය ගණනය කොට එම වටිනාකම කොන්ත්‍රාත්තුවට අය කෙරේ.

උදාහරණ : 02

සමාගමක් රු. 5,000,000 ක් වූ පිරිවැයක් ඇති (භාවිත කළ පසු අගයක් නොමැති) යන්ත්‍රයක් භාවිත කරන අතර, එය සරල මාර්ග ක්‍රමයට 20% බැගින් වාර්ෂිකව ක්ෂය කරයි නම් හා එය කොන්ත්‍රාත්තුව සඳහා මාස 03 ක් පමණක් භාවිත කළේ නම්,

කොන්ත්‍රාත්තුවට අය කළ යුතු ක්ෂය ප්‍රමාණය = $5,000,000 \times 20\% \times \frac{3}{12}$

= රු. 250,000

කොන්ත්‍රාත්තුවට අදාළ පිරිවැය සෙවීමේදී, මෙම ප්‍රමාණය යන්ත්‍ර වලට අදාළ ක්ෂය ලෙස කොන්ත්‍රාත් ගිණුමට හර කළ යුතුය.

ක්‍රමය (2) : කුලියක් අය කිරීම

වැඩබිමෙන් වැඩබිමට යන්ත්‍ර නිතරම මාරු කරන විට, මධ්‍යම සේවා අංශයක් (a central service department) විසින් දෛනික හෝ සති පදනම මත ගණනය කළ ක්ෂය ප්‍රමාණයක්, කුලියක් ලෙස කොන්ත්‍රාත්තුවට අය කෙරේ. මෙහිදී සටහන් කරගත යුතු කරුණක් වන්නේ, කොන්ත්‍රාත්තුව තුළ යන්ත්‍ර කෙටි කාලයක් සඳහා භාවිතයට ගැනේ නම් මෙම ක්‍රමය වඩාත් සුදුසු වන බවයි.

ක්‍රමය (3) : මාරු කිරීමේදී යන්ත්‍ර අගය කිරීම

යන්ත්‍ර සඳහා ගිණුම් තැබීමේ තුන්වන ක්‍රමය වන්නේ, මාරු කරන විට යන්ත්‍ර අගය කිරීමයි. මෙම ක්‍රමයේදී සිදුවන්නේ කොන්ත්‍රාත්තුව සඳහා යන්ත්‍ර මාරුකරන විට ඒවා අගය කර එම වටිනාකම කොන්ත්‍රාත් ගිණුමට හර කෙරේ. එම යන්ත්‍ර භාවිත කර එම කොන්ත්‍රාත්තුවෙන් වෙනත් කොන්ත්‍රාත්තුවක් වෙත මාරුකරන විට ඒවා නැවත අගය කොට එම වටිනාකම කොන්ත්‍රාත් ගිණුමට බැර කෙරේ. මෙහිදී එම වටිනාකම් අතර වෙනස, එනම් ක්ෂය ප්‍රමාණය කොන්ත්‍රාත්තු ගිණුමට ඉබේම අයවී ඇත.

ගිණුම් වර්ෂය අග වන විටත්, අදාළ යන්ත්‍ර කොන්ත්‍රාත්තුව තුළ භාවිත වෙමින් පවතී නම්, එම දිනට අගය කොට, එම වටිනාකම කොන්ත්‍රාත් ගිණුමෙන් පහළට (බැර) ගෙන ආ යුතු අතර ඊළඟ කාලපරිච්ඡේදයේ මුල දිනට කොන්ත්‍රාත් ගිණුමෙන් ඉදිරියට (හර) ගෙන ආ යුතුය.

පොදුකාර්ය පිරිවැය (Overhead Costs)

දැනටමත් පැහැදිලි කර ඇති පරිදි, විදුලිය (ආලෝකය හා බලය), නඩත්තු වියදම්, ගෘහ නිර්මාණ ශිල්පී ගාස්තුව, කුලී ගාස්තු, දුරකථන..... වැනි බොහෝ වියදම්, ඍජු වියදම් ලෙස සලකන අතර ඒවා ඍජුවම කොන්ත්‍රාත් ගිණුමට අය කෙරේ. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තු කීපයකට අදාළ වන, ප්‍රධාන කාර්යාල වියදම් වැනි අයිතමයන් යම් සාධාරණ පදනමක් මත, ඒ ඒ කොන්ත්‍රාත්තුවට විභාජනය කළ යුතුය. මෙහිදී නිෂ්පාදන පොදුකාර්ය පමණක්, කොන්ත්‍රාත්තුව කරගෙන යන අතරතුරදී කොන්ත්‍රාත් ගිණුමට අයකළ යුතු අතර ප්‍රධාන කාර්යාල සාමාන්‍ය වියදම් වැනි නිෂ්පාදන නොවන පොදුකාර්ය, කොන්ත්‍රාත්තුව අවසන් නම් පමණක් කොන්ත්‍රාත්තුවට අයකළ යුතුය. මන්ද, කොන්ත්‍රාත්තුවට අදාළ අවසන් කෙරීගෙන යන වැඩ වටිනාකම තුළ තිබිය හැක්කේ නිෂ්පාදන පොදුකාර්ය පමණි.

අමතර වැඩ (Extra Work)

දෙපාර්ශවය එකඟ වූ මූලික කොන්ත්‍රාත් ගිවිසුම වෙනස් කරමින් ගණුදෙනුකරු (Client) විසින් කොන්ත්‍රාත්කරුට අමතර වැඩ පැවරීම, කොන්ත්‍රාත්තු වලදී සාමාන්‍යයෙන් සිදුවන දෙයකි.

එවැනි විටකදී, ඒවා අමතර කාර්යයන් නිසා ඒ සඳහා ගණුදෙනුකරුගෙන් වෙනම අයකිරීමක් කළ යුතු වේ. මෙලෙස ඉටුකරන සියලුම අමතර වැඩ පිළිබඳව වෙනම වාර්තාවක් කොන්ත්‍රාත්කරු තබාගත යුතු අතර ඒවායේ එකතුව කොන්ත්‍රාත් ගිණුමට හර කිරීම හෝ ඒ සඳහා වෙනමම ගිණුමක් පවත්වා ගැනීම හෝ කළ හැක.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 15 පිළිබඳ කෙටි අධ්‍යයනයක් (SLFRS – 15)

ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පිළිබඳව වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 15 හි ප්‍රධාන අරමුණ වන්නේ, කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ප්‍රකාශන තුළ කොන්ත්‍රාත්තු වලට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ ගිණුම්කරණ බලපෑම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමයි.

ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාළ කාර්යයේ ස්වභාවය නිසාම, එම කාර්යය ආරම්භ කරන දිනය හා අවසන් කරන දිනය සාමාන්‍යයෙන් ගිණුම්කරණ වර්ෂ දෙකකට අදාළ වේ. එම නිසා, ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා ගිණුම් තැබීමේදී මතුවන ප්‍රධාන ගැටළුව වන්නේ, කොන්ත්‍රාත්තුවට අදාළ ආදායම් හා පිරිවැය එම ගිණුම්කරණ කාලපරිච්ඡේද අතර කෙසේ බෙදා දෙන්නේද යන්නයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 15 මගින් මෙම ප්‍රායෝගික ගැටළුව විසඳීම සඳහා නිසි මග පෙන්වීමක් සිදුවේ.

කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රතිඵලය නැතහොත් නිමවුම විශ්වාසයෙන් ඇස්තමේන්තු කළ හැකි විට, ගිණුම් වර්ෂයේ අග දිනට කොන්ත්‍රාත්තුවට අදාළ **නිමකළ අදියර (stage of completion)** පදනම් කරගෙන වියදම් හා ආදායම් හඳුනා ගැනීම සිදු වේ. කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රතිඵලය නැතහොත් නිමවුම විශ්වාසයෙන් ඇස්තමේන්තු කළ නොහැකි විට, කොන්ත්‍රාත්තුව මත ලාභයක් හඳුනා නොගත යුතුය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 15 ට අනුව, කොන්ත්‍රාත්තුවකට අදාළ නිමකළ අදියර විවිධ ආකාරයෙන් තීරණය කළ හැක. ඒවානම්;

(a) නිමකළ අදියර = $\frac{\text{මේ දක්වා කොන්ත්‍රාත්තුවට අදාළ පිරිවැය}}{\text{ඇස්තමේන්තු ගත මුළු පිරිවැය}}$

(b) මේ දක්වා කර ඇති කාර්යයන් පිළිබඳ සමීක්ෂණයක් මගින් තීරණය කිරීම. (by a survey of work performed)

(c) කොන්ත්‍රාත්තුවට අදාළ භෞතික නිමාව, නිමකළ අදියර ලෙස ගැනීම.

ගණුදෙනුකරුගෙන් ලැබුණු අත්තිකාරම් මුදල් හෝ ප්‍රගති ගෙවීම්, නිමකළ අදියර පිළිබඳ නිර්ණායකයන් නොවේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 15 තුළ හඳුනාගන්නා එකිනෙකට වෙනස් කොන්ත්‍රාත්තු වර්ග දෙකකි.

- **ස්ථාවර මිල කොන්ත්‍රාත්තු :** ස්ථාවර කොන්ත්‍රාත්තු මිලකට හෝ නිමි ඒකකයක් සඳහා ස්ථාවර / අනුපාතයකට කොන්ත්‍රාත්කරු එකඟවන්නේ නම් එම කොන්ත්‍රාත්තු වේ.

- **පිරිවැය එකතු කොන්ත්‍රාත්තු :** කොන්ත්‍රාත්කරු දැරූ සත්‍ය පිරිවැය හා එයින් ප්‍රතිශතයක් ලෙස ගණනය කළ ගාස්තුවක් කොන්ත්‍රාත්කරුට ගෙවයි නම් එවැනි කොන්ත්‍රාත්තු වේ.

කොන්ත්‍රාත්තුවක පිරිවැය ගණනය කිරීම

කොන්ත්‍රාත්තුවක මුළු පිරිවැය තුළ පහත කොටස් අඩංගු වේ.

(a)	සෘජු පිරිවැය	:	වැඩබිම් වැටුප්, භාවිතා කළ ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ වල ක්ෂය....... වැනි.
(b)	ආරෝපනය කළ හැකි පිරිවැය	:	රක්ෂණය, සැලසුම් සකස් කිරීමේ හා අනෙකුත් තාක්ෂණික පිරිවැය වැනි වක්‍ර ස්වභාවයේ පිරිවැය.
(c)	වෙනත් පිරිවැය	:	කොන්ත්‍රාත්තු ගිවිසුමට අනුව, ගණුදෙනුකරුගෙන් අයකර ගන්නා වෙනත් පිරිවැය.

උදාහරණ : 03

2013 අප්‍රේල් 25 වන දින, සීමිත ඒෂියන් කොන්ත්‍රාත්කරුවෝ (Asian Contractors PLC), 2014 ජුනි 20 දින නිමකිරීමට සැලසුම් කරමින් රු. මිලියන 110 ක් වූ කොන්ත්‍රාත් මිලක් ඇති සුපිරි වෙළඳසැලක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවක් ආරම්භ කරන ලදී. ඒෂියන් පී.එල්.සී. හි මුදල් වර්ෂය මාර්තු 31 න් අවසන් වේ. 2014 මාර්තු 31 දිනට, ඉහත කොන්ත්‍රාත්තුවට අදාළ වාර්තා වල පහත තොරතුරු අඩංගු විය.

	රු. '000
වැඩබිමට නිකුත් කළ ද්‍රව්‍ය	21,232
වැඩබිමෙන් හරවා එවූ ද්‍රව්‍ය	2,342
ගෙවූ සෘජු වැටුප්	9,130
වැඩබිමෙහි ඇති යන්ත්‍රෝපකරණ (පිරිවැයට)	11,335
සුපරීක්ෂක වේතන - සෘජු	1,050
- වක්‍ර	1,370
බෙදාහල ප්‍රධාන කාර්යාල වියදම්	9,200
සහතික කළ වැඩ සඳහා ලැබූ මුදල්	44,980
කොන්ත්‍රාත්තුව නිම කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය	28,675

රු. 8,010,000 ක් වැයකරමින්, ඒෂියන් පී.එල්.සී. සමාගම මෙම වැඩබිම සඳහා විශේෂ යන්ත්‍රයක් කුලියට ලබාගෙන ඇත. සමාගමට අයත් යන්ත්‍රෝපකරණ 20% ක් වූ අනුපාතයක් යටතේ සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.

2014 මාර්තු 31 දිනට අවසාන ශේෂයන්;

උපචිත වැටුප්	-	රු. 320,000
වැඩබිම තුළ ඇති ද්‍රව්‍ය	-	රු. 3,210,000

ඔබ විසින් කළයුතු වන්නේ,

(i) 2014 මාර්තු 31 න් අවසන් කාලපරිච්ඡේදය සඳහා කොන්ත්‍රාත් ගිණුම සකස් කර, එම දිනට කොන්ත්‍රාත්තුවට අදාළ පිරිවැය ගණනය කිරීමයි.

පිළිතුරු :

සුපිරි වෙළඳසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම - කොළඹ
2014/03/31 දිනට කොන්ත්‍රාත් ගිණුම රු. '000

නිකුත් කළ ද්‍රව්‍ය	21,232	ද්‍රව්‍ය ආපසු එවුම්	2,342
ගෙවූ සෘජු වැටුප්	9,130	අවසන් ද්‍රව්‍ය තොග ප/ගෙ	3,210
යන්ත්‍රෝපකරණ	11,335	යන්ත්‍රෝපකරණ ප/ගෙ	9,257
සුපරීක්ෂණ වේතන - සෘජු	1,050		
සුපරීක්ෂණ වේතන - වක්‍ර	1,370	මේ දක්වා වූ පිරිවැය	46,838
ප්‍රධාන කාර්යාල වියදම්	9,200		
යන්ත්‍ර - කුලී	8,010		
උපචිත වැටුප් ප/ගෙ	320		
	61,647		61,647
ද්‍රව්‍ය තොග ඉ/ගෙ	3,210	උපචිත වැටුප් ඉ/ගෙ	320
යන්ත්‍රෝපකරණ ඉ/ගෙ	9,257		
මේ දක්වා වූ පිරිවැය ඉ/ගෙ	46,838		

මෙහිදී සටහන් කරගත යුතු කරුණක් වන්නේ, ගණුදෙනුකරුගෙන් ලැබූ මුදල් හෝ කොන්ත්‍රාත්තුව නිම කිරීමට ඇස්තමේන්තුගත ඉදිරි පිරිවැය කොන්ත්‍රාත් ගිණුම තුළට ඇතුලත් නොකෙරේ.

<u>සටහන්</u>

(1) යන්ත්‍රෝපකරණ මත ක්ෂය :

$$11{,}335{,}000 \times 20\% \times \frac{11}{12} = \underline{\text{රු. } 2{,}078\ (000)}$$

එමනිසා, 2014/03/31 දිනට වටිනාකම = 11,335 – 2,078
= <u>රු. 9,257 (000)</u>

පෙරසැරි පිරිවැයකරණය

PROCESS COSTING

මෙය අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයකරණයට අයත් එක් පිරිවැයකරණ ක්‍රමයකි. අඛණ්ඩ නිෂ්පාදන මෙහෙයුමක් තුළින්, එක සමාන අයිතම් මහා පරිමාණ වශයෙන් නිෂ්පාදනය කරන ආයතන විසින් පෙරසැරි පිරිවැයකරණය භාවිත කරයි. මෙම නිෂ්පාදන මෙහෙයුම තුළ පෙරසැරි නැතහොත් ක්‍රියාවලීන් කීපයක් ඇතුලත් විය හැක. මෙහිදී නිෂ්පාදන ලෙස නිමවීමට, අමුද්‍රව්‍ය හා අනෙකුත් යෙදවුම් වලට පෙරසැරි දෙකක් හෝ කීපයක් පසු කිරීමට සිදුවේ. නිදසුන් ලෙස, ඇඟළුම්, සබන්, බිස්කට්, තීන්ත, සිමෙන්ති, රසායන ද්‍රව්‍ය, බෙහෙත් වර්ග, පුවත් පත්, විදුලි උපකරණ මෙන්ම තෙල් පිරිපහදුව, කිරි ආශ්‍රිත නිෂ්පාදන වැනි කර්මාන්ත වල නියැලුනු සමාගම් මෙම පිරිවැයකරණ ක්‍රමය භාවිත කරයි. ඇඟළුම් කම්හලකට සම්බන්ධ පෙරසැරි ක්‍රියාත්මක වන ආකාරය, පහත රූපය මගින් ඉදිරිපත් කර ඇත.



ඇඟළුම් කම්හලක නිෂ්පාදන මෙහෙයුම

ඉහත රූපය මගින් ඉදිරිපත් කර ඇති පරිදි භාණ්ඩය නිමවන තුරු එක් පෙරසැරියක නිමවුම, ඊළඟ පෙරසැරියෙහි යෙදවුම (මූලික අමුද්‍රව්‍ය) වේ. මේ ආකාරයට ගමන් කර, අවසාන පෙරසැරිය තුළින් අවසාන නිමවුම පිටතට පැමිණේ.

කාර්යය පිරිවැයකරණය හා පෙරසැරි පිරිවැයකරණය සැසඳීම

Job Costing Vs. Process Costing

කාර්යය පිරිවැයකරණය	පෙරසැරි පිරිවැයකරණය
(1) ගණුදෙනුකරුවෙකුගේ විශේෂ ඇනවුමක් මත නිෂ්පාදනය සිදු වේ.	(1) ඉල්ලුමක් අපේක්ෂාවෙන් අඛණ්ඩ මෙහෙයුමක් තුළින් නිෂ්පාදනය සිදුවේ.
(2) නිෂ්පාදන එකිනෙකට වෙනස් වේ. (Unique products)	(2) නිෂ්පාදන සැම අතින්ම සමාන වේ. (Uniform products)
(3) කෙරීගෙන යන වැඩ තිබීමට හෝ නොතිබීමට ඉඩ තිබේ.	(3) කාලපරිච්ඡේදයේ ආරම්භයේදී හෝ අවසානයේදී කෙරීගෙන යන වැඩ පවතී.
(4) ඒ ඒ කාර්යය සඳහා පිරිවැය එක් රැස් කෙරේ.	(4) ඒ ඒ පෙරසැරිය සඳහා පිරිවැය එක්රැස් කෙරේ.
(5) ඒ ඒ කාර්යයේ පිරිවැය වෙන වෙනම ගණනය කළ යුතුය.	(5) සමස්ථයක් ලෙස පෙරසැරිය සඳහා වූ පිරිවැය ගණනය කෙරේ.
(6) ඒ ඒ කාර්යයේ පිරිවැය වෙන වෙනම ගණනය කළ යුතු නිසා, වැඩ අධික වේ.	(6) සමස්ථයක් ලෙස ගණනය කරන හෙයින් වැඩ අවම වේ.
(7) ව්‍යාපාරික ස්ථානයේදී හෝ ගණුදෙනුකරුගේ ස්ථානයේදී කාර්යය ඉටුකිරීම සිදු වේ.	(7) සමාගමේ පරිශ්‍රයේදී පමණක් සිදු කෙරේ.

පෙරසැරියක් තුළ අපතයන් හා ලාභ (Losses and gains in process)

ද්‍රව්‍ය පෙරසැරියට යොමුකළ විට, එහි ප්‍රතිඵලයක් ලෙස ඒවායේ ප්‍රමාණය හෝ බර වැඩිවීම හෝ අඩුවීම සිදු වේ.

සාමාන්‍ය අපතය (Normal Losses)

යෙදවුම් කරන අමුද්‍රව්‍ය වල හෝ පෙරසැරියෙහි ස්වභාවය මත, ඇතැම් අපතයන් ආවේණික හා වැලැක්විය නොහැකි වේ. මෙම අපතය, සාමාන්‍ය අපතය හෙවත් සාමාන්‍ය නාස්ථිය ලෙස හැඳින්වේ. සාමාන්‍ය තත්වයන් තුළ මෙම අපතයන් බලාපොරොත්තු වේ. එනම්, කළමනාකරණය ඔවුන්ගේ පසුගිය අත්දැකීම් අනුව එම අපතය ප්‍රතිශතයක් ලෙස බලාපොරොත්තු වේ. මෙම සාමාන්‍ය අපතයට අදාළ පිරිවැය, හොඳ නිෂ්පාදනය මගින් දරාගත යුතුය. අනෙක් අතට, සාමාන්‍ය අපතය විකුණාගත හැකි නම්, එම වටිනාකම පිරිවැය නැවත ලැබීමක් සේ සලකා දැරූ පිරිවැයෙන් අඩුකළ යුතු අතර එහෙයින් එම වටිනාකම පෙරසැරියේ පිරිවැය අඩුකිරීමට හේතු වේ. සාමාන්‍ය අපතය උපලබ්ධියෙන් ලැබෙන වටිනාකම, එහි "සුන්බුන් අගය" (Scrap Value) ලෙස හැඳින්වේ. එනම්;

දළ පෙරසැරි පිරිවැය		XXX
(-)	සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය	(XX)
∴ ශුද්ධ පෙරසැරි පිරිවැය		XXX

පෙරසැරි පිරිවැයකරණයේදී සාමාන්‍ය අපතයේ පිරිවැය සෙවීම නිෂ්ඵල කටයුත්තක් වන අතර එය ගිණුම්ගත කරන එකම වටිනාකම වන්නේ එහි සුන්බුන් අගයයි.

උදාහරණ : 01

ආහාර නිෂ්පාදනය කරන පෙරසැරියක සාමාන්‍ය අපතය එහි යෙදවුම් වලින් 10% කි. මේවා කිලෝ එකක් රු. 5/= බැගින් සත්ව ආහාරයක් ලෙස විකුණාගත හැක. යම් කාලපරිච්ඡේදයක් සඳහා ඉහත පෙරසැරියට අදාළව පහත දත්ත සටහන් වී තිබුණි.

යෙදවුම් :
අමුද්‍රව්‍ය කිලෝවක් රු. 20 බැගින් කිලෝග්‍රෑම් 1,000 ක්
ශ්‍රමය හා පොදුකාර්ය පිරිවැය රු. 25,500 කි.
සත්‍ය අපතය බලාපොරොත්තු මට්ටමට සිදුවිය.
නිමවුම් කිලෝවක පිරිවැය ගණනය කරන්න.

පිළිතුර :

ඒකක	කිලෝ
යෙදවුම්	1,000
(-) සාමාන්‍ය අපතය (10%)	100
බලාපොරොත්තු නිෂ්පාදනය	900

Upul Abeysooriya [B.Sc. (B. Admin), FCA, FCMA]

පිරිවැය		රු.
යෙදවුම්	- අමුද්‍රව්‍ය (1000 Kgs @ රු. 20/=)	20,000
	- ශ්‍රමය හා පොදුකාර්ය	25,500
	දළ පෙරසැරි පිරිවැය	45,500
(-)	සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය (100 @ රු. 5/=)	500
	∴ ශුද්ධ පෙරසැරි පිරිවැය	45,000

∴ නිමවුම් කිලෝවක පිරිවැය $= \frac{45,000}{900}$

= රු. 50

අසාමාන්‍ය අපතය / අසාමාන්‍ය පාඩුව (Abnormal Loss)

ඇතැම් අවස්ථා වලදී, සාමාන්‍ය අපතයට වඩා සත්‍ය අපතය වැඩි වේ. සාමාන්‍ය අපතය ඉක්මවා ගිය සත්‍ය අපතය, "අසාමාන්‍ය අපතය" ලෙස සැලකේ; හෙවත් අමතර අපතය වේ. හදිසි සිදුවීම්, බාල අමුද්‍රව්‍ය, සේවකයන්ගේ නොසැලකිල්ල වැනි හේතු නිසා අසාමාන්‍ය අලාභ ඇති වේ. අසාමාන්‍ය අපතය පාලනය කළ හැකි නැතහොත් වැලැක්විය හැකි වේ. පිරිවැයකරණය තුළ සාමාන්‍ය අපතයේ සහ අසාමාන්‍ය අපතයේ බලපෑම එකිනෙකට වෙනස් වේ. සාමාන්‍ය අපතයේ පිරිවැය, හොඳ නිෂ්පාදනය විසින් දරාගනු ලැබුවද, අසාමාන්‍ය අපතයේ පිරිවැය හොඳ නිෂ්පාදනය විසින් දරාගනු නොලැබේ. හොඳ නිෂ්පාදන ඒකක මෙන්ම, අසාමාන්‍ය අපතය ද අගය කරනුයේ ඒවායේ පිරිවැයටයි. එනම් හොඳ නිෂ්පාදනය අගය කිරීම සඳහා භාවිතා කරන ඒකකයක පිරිවැය, අසාමාන්‍ය අපතය අගය කිරීම සඳහා ද භාවිත වේ.

උදාහරණ : 02

ඉහත ආහාර නිෂ්පාදන සමාගමේ, සත්‍ය නිෂ්පාදනය කිලෝග්‍රෑම් 880 ක් වූයේ නම්,

	කිලෝ			**කිලෝ**
යෙදවුම්	1,000	හෝ	සාමාන්‍ය අපතය	100
(-) සාමාන්‍ය අපතය (10%)	100		සත්‍ය අපතය	120
බලාපොරොත්තු නිෂ්පාදනය	900		∴ අසාමාන්‍ය පාඩුව	20
සත්‍ය නිෂ්පාදනය	880			
∴ අසාමාන්‍ය පාඩුව	20			

එමනිසා, අසාමාන්‍ය අපතයේ වටිනාකම = කිලෝ 20 x රු. 50

= රු. 1,000

අසාමාන්‍ය ලාභය (Abnormal gain)

සත්‍ය අපතය, සාමාන්‍ය හෙවත් බලාපොරොත්තු අපතයට වඩා අඩුනම් එම වෙනස අසාමාන්‍ය ලාභය ලෙස හැඳින්වේ. වෙනත් වචන වලින් කිවහොත්, අසාමාන්‍ය ලාභයක් ඇතිවන්නේ, බලාපොරොත්තු නිෂ්පාදනයට වඩා සත්‍ය නිෂ්පාදනය වැඩි වූ විටයි. අසාමාන්‍ය අපතය සේම, අසාමාන්‍ය ලාභය ද අගය කරනුයේ එහි පිරිවැයටයි.

උදාහරණ : 03

ඉහත ආහාර නිෂ්පාදන සමාගමේ, සත්‍ය නිෂ්පාදනය කිලෝග්‍රෑම් 920 ක් වූයේ නම්,

	කිලෝ
යෙදවුම්	1,000
(-) සාමාන්‍ය අපතය (10%)	100
බලාපොරොත්තු නිෂ්පාදනය	900
සත්‍ය නිෂ්පාදනය	920
∴ අසාමාන්‍ය පාඩුව	20

හෝ

	කිලෝ
සාමාන්‍ය අපතය	100
සත්‍ය අපතය	80
∴ අසාමාන්‍ය ලාභය	20

එමනිසා, අසාමාන්‍ය ලාභයේ වටිනාකම = කිලෝ 20 x රු. 50
= රු. 1,000

පෙරසැරි ගැටළු විසඳන ආකාරය

මූලික පෙරසැරි ගැටළුවක් විසඳීමේදී පහත සඳහන් පියවර අනුගමනය කළ යුතුය.

පියවර 1 පෙරසැරිය තුළ තොග දී ඇත්දැයි බලන්න. (සාමාන්‍යයෙන් පෙරසැරියක් තුළ තිබිය හැක්කේ කෙරීගෙන යන ඒකක පමණි). තොග දී නොමැති නම් පහත පියවර අනුගමනය කරන්න.

පියවර 2 යෙදවුම් වලින් සාමාන්‍ය අපතය අඩුකොට බලාපොරොත්තු නිෂ්පාදනය ලබාගන්න.

පියවර 3 එලෙස ගණනය කළ බලාපොරොත්තු නිෂ්පාදනය සමග සත්‍ය නිෂ්පාදනය සසඳා අසාමාන්‍ය ලාභය හෝ අසාමාන්‍ය පාඩුව හඳුනා ගන්න.

	ඒකක
යෙදවුම්	XXX
(-) සාමාන්‍ය අපතය	(XX)
බලාපොරොත්තු නිෂ්පාදනය	XXX
සත්‍ය නිෂ්පාදනය	XXX
∴ අසාමාන්‍ය ලාභය / අසාමාන්‍ය පාඩුව	XX

පියවර 4 පෙරසැරිය වෙනුවෙන් දරන ලද සියලුම පිරිවැය එකතු කොට දළ පෙරසැරි පිරිවැය ලබාගන්න. (විචල්‍ය / ස්ථාවර හා ඍජු / වක්‍ර)

පියවර 5 දළ පෙරසැරි පිරිවැයෙන්, සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය අඩුකොට පහත පරිදි ශුද්ධ පෙරසැරි පිරිවැය ලබාගන්න.

මූලික අමුද්‍රව්‍ය	XX
අතිරේක අමුද්‍රව්‍ය	XX
ඍජු වැටුප්	XX
ඍජු වියදම්	XX
නිෂ්පාදන පොදුකාර්ය	XX
දළ පෙරසැරි පිරිවැය	XXX
(-) සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය	(XX)
∴ ශුද්ධ පෙරසැරි පිරිවැය	XXX

පියවර 6 ඉහත පරිදි ගණනය කළ ශුද්ධ පෙරසැරි පිරිවැය, බලාපොරොත්තු නිෂ්පාදනයෙන් බෙදා ඒකකයක පිරිවැය ලබාගන්න.

$$\text{ඒකකයක පිරිවැය} = \frac{\text{ශුද්ධ පෙරසැරි පිරිවැය}}{\text{බලාපොරොත්තු නිෂ්පාදනය}}$$

පියවර 7 ඉහත ගණනය කළ ඒකකයක පිරිවැය, සත්‍ය නිෂ්පාදනයෙන් ගුණකොට, ඊළඟ පෙරසැරියට නැතහොත් නිමි තොගයට මාරුකරන පිරිවැය ලබාගන්න.

මාරුකරන පිරිවැය = ඒකකයක පිරිවැය x සත්‍ය නිෂ්පාදනය

පියවර 8 පෙරසැරි ගිණුම් සකස් කරන්න.

- පෙරසැරි ගිණුම්
- සාමාන්‍ය අපතය ගිණුම්
- අසාමාන්‍ය අපතය හෝ අසාමාන්‍ය ලාභ ගිණුම්

උදාහරණ : 04

යම් භාණ්ඩයක් පෙරසැරි I හා පෙරසැරි II නමින් පෙරසැරි 2 ක් පසුකර නිමි තොගයට මාරු වේ. ඒ ඒ පෙරසැරියට අදාළ සාමාන්‍ය අපතයන් පහත පරිදි වේ.

පෙරසැරි I - යෙදවුම් වලින් 10%
පෙරසැරි II - යෙදවුම් වලින් 5%

පෙරසැරි I හි අපතය ඒකකයක් රු. 0.40 බැගින් ද, පෙරසැරි II හි අපතය ඒකකයක් රු. 0.50 බැගින් ද අලෙවි කර ගත හැක. ඒකකය රු. 0.62 බැගින් ඒකක 10,000 ක් පෙරසැරි I ට යෙදවුම් කර ඇත.

අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

		එකතුව	පෙරසැරි I	පෙරසැරි II
අතිරේක අමුද්‍රව්‍ය	(රු.)	18,000	8,500	9,500
ඍජු ශ්‍රමය	(රු.)	10,000	4,000	6,000
ඍජු වියදම්	(රු.)	2,130	1,200	930
ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය	(රු.)	7,500		
සත්‍ය නිෂ්පාදනය	(ඒකක)		9,200	8,700

- ඍජු ශ්‍රම පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කළ යුතු වේ.
- කිසිම පෙරසැරියක ආරම්භක හෝ අවසාන කෙරීගෙන යන වැඩ නොතිබුණි.

පෙරසැරි ගිණුම් හා අදාළ අනෙකුත් ගිණුම් සකස් කරන්න.

පිළිතුර :

පෙරවැඩ :

සටහන (1)

නිෂ්පාදන ඒකක හා පිරිවැය ප්‍රකාශය

	පෙරසැරි I	පෙරසැරි II	
යෙදවුම්	10,000	9,200	නිෂ්පාදන ඒකක පියවර (2) හා (3)
(-) සාමාන්‍ය අපතය	(1,000)	(460)	
බලාපොරොත්තු නිෂ්පාදනය	9,000	8,740	
සත්‍ය නිෂ්පාදනය	9,200	8,700	
∴ අසාමාන්‍ය ලාභය	200		
∴ අසාමාන්‍ය පාඩුව		40	
පිරිවැය :	**රු.**	**රු.**	
මූලික අමුද්‍රව්‍ය	6,200	23,000	පිරිවැය ප්‍රකාශය පියවර (4), (5), (6) සහ (7)
අතිරේක අමුද්‍රව්‍ය	8,500	9,500	
ඍජු ශ්‍රමය	4,000	6,000	
ඍජු වියදම්	1,200	930	
ස්ථාවර නිෂ්පාදන පො/කා (සටහන 2)	3,000	4,500	
දළ පෙරසැරි පිරිවැය	22,900	43,930	
(-) සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය	(400)	(230)	
ශුද්ධ පෙරසැරි පිරිවැය	22,500	43,700	
ඒකකයක පිරිවැය	22,500/9,000	43,700/8,740	
	2.50	5	
∴ සත්‍ය නිෂ්පාදනයේ මුළු පිරිවැය	2.50 x 9,200	5 x 8,700	
	23,000	43,500	

සටහන (2) : ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය අන්තර්ග්‍රහණය (ඍජු ශ්‍රම පිරිවැය මත)

පෙරසැරි I - $7,500 \times \frac{4,000}{10,000}$ = රු. 3,000

පෙරසැරි II - $7,500 \times \frac{6,000}{10,000}$ = රු. 4,500

විවෘත කළ යුතු ගිණුම් (ඉහත නිදසුනට අදාළව)

පෙරසැරි I - ගිණුම
පෙරසැරි I - සාමාන්‍ය අපතය ගිණුම
පෙරසැරි I - අසාමාන්‍ය ලාභ ගිණුම
පෙරසැරි II - ගිණුම
පෙරසැරි II - සාමාන්‍ය අපතය ගිණුම
පෙරසැරි II - අසාමාන්‍ය පාඩු ගිණුම

පෙරසැරි I

		ඒකක	මිල	වටිනාකම (රු.)			ඒකක	මිල	වටිනාකම (රු.)
(1)	ඉ/ශෙ	-	-	-	(3)	සාමාන්‍ය අපතය	1,000	0.40	400
(2)	මූලික අමුද්‍රව්‍ය	10,000	0.62	6,200	(5)	පෙරසැරි II ට මාරු	9,200	2.50	23,000
(2)	අතිරේක අමුද්‍රව්‍ය			8,500					
(2)	සෘජු ශ්‍රමය			4,000					
(2)	සෘජු වියදම්			1,200					
(2)	නිෂ්. පො/කා			3,000					
(4)	අසාමාන්‍ය ලාභ	200	2.50	500	(6)	ප/ශෙ	-	-	-
		10,200		23,400			10,200		23,400

පෙරසැරි I - සාමාන්‍ය අපතය

(3)	පෙරසැරි I	1,000	0.40	400	(7)	අසාමාන්‍ය ලාභ	200	0.40	80
					(9)	මුදල්	800	0.40	320
		1,000		400			1,000		400

පෙරසැරි I - අසාමාන්‍ය ලාභ

(7)	සාමාන්‍ය අපතය	200	0.40	80	(4)	පෙරසැරි I	200	2.50	500
(8)	පිරිවැය ලා/ලා			420					
		200		500			200		500

පෙරසැරි II

(1)	ඉ/ශෙ	-	-	-		සාමාන්‍ය අපතය	460	0.50	230
(5)	පෙරසැරි I න් මාරු	9,200	2.50	23,000	(10)	අසාමාන්‍ය පාඩුව	40	5	200
	අතිරේක අමුද්‍රව්‍ය			9,500	(11)	නිමිතොගයට මාරු	8,700	5	43,500
	සෘජු ශ්‍රමය			6,000					
	සෘජු වියදම්			930					
	නිෂ්පාදන පො/කා			4,500		ප/ශෙ	-		-
		9,200		43,930			9,200		43,930

පෙරසැරි II - සාමාන්‍ය අපතය

පෙරසැරි II	460	0.50	230	මුදල්	500	0.50	250
(12) අසාමාන්‍ය පාඩු	40	0.50	20				
	500		250		500		250

පෙරසැරි II - අසාමාන්‍ය පාඩු

(10) පෙරසැරි II	40	5	200	(12) සාමාන්‍ය අපතය	40	0.50	20
				(13) පිරිවැය ලා/ලා			180
	40		200		40		200

ද්විත්ව සටහන් :

(1) ආරම්භක නොනිමි තොගයේ වටිනාකම (පිරිවැය) අදාළ පෙරසැරි ගිණුමෙන් ඉදිරියට (හර) ගෙන ආ යුතුය.

(2) පෙරසැරිය වෙනුවෙන් දැරූ සියලුම පිරිවැය
පෙරසැරි ගිණුම හර
අදාළ පිරිවැය පාලන ගිණුම් බැර

(3) සාමාන්‍ය අපතයේ සුන්බුන් අගය
සාමාන්‍ය අපතය ගිණුම හර
පෙරසැරි ගිණුම බැර

(4) පෙරසැරි I හි අසාමාන්‍ය ලාභය (පිරිවැයට)
පෙරසැරි ගිණුම හර
අසාමාන්‍ය ලාභ ගිණුම බැර

(5) පෙරසැරි I හි සත්‍ය නිෂ්පාදනය පෙරසැරි II ට මාරු කිරීම (පිරිවැයට)
පෙරසැරි II ගිණුම හර
පෙරසැරි I ගිණුම බැර

(6) අවසාන කෙරීගෙන යන වැඩවල පිරිවැය පෙරසැරි ගිණුමෙන් පහළට (බැර) ගෙන යා යුතුය.

(7) අසාමාන්‍ය ලාභය තුළ සැඟවුනු පාඩුව
අසාමාන්‍ය ලාභය හේතුවෙන්, අපතය එම ප්‍රමාණයෙන් අඩුවේ. එම අඩුවූ අපතයේ කැපකළ සුන්බුන් අගය මේ නමින් හැඳින්වේ.
අසාමාන්‍ය ලාභ ගිණුම හර
සාමාන්‍ය අපතය ගිණුම බැර

(8) අසාමාන්‍ය ලාභ ගිණුමේ ශේෂය පිරිවැය ලාභාලාභ ගිණුමට මාරු කරන්න.
අසාමාන්‍ය ලාභ ගිණුම හර
පිරිවැය ලාභාලාභ ගිණුම බැර

(9) සත්‍ය අපතය විකුණා ලැබෙන මුදල්
මුදල් හර
සාමාන්‍ය අපතය බැර

(10) පෙරසැරි II හි අසාමාන්‍ය පාඩුව (පිරිවැයට)
අසාමාන්‍ය පාඩු ගිණුම හර
පෙරසැරි ගිණුම බැර

(11) පෙරසැරි II හි සත්‍ය නිෂ්පාදනය, නිමි තොග පාලන ගිණුමට මාරු කිරීම (පිරිවැයට)
නිමිතොග පාලන ගිණුම හර
පෙරසැරි II ගිණුම බැර

(12) අසාමාන්‍ය පාඩුව තුළ සැඟවුනු ලාභය
එනම් අමතර අපතයට අදාළ සුන්බුන් අගය වේ.
සාමාන්‍ය අපතය ගිණුම හර
අසාමාන්‍ය පාඩු ගිණුම බැර

(13) අසාමාන්‍ය පාඩු ගිණුමේ ශේෂය, පිරිවැය ලාභාලාභ ගිණුමට මාරු කරන්න.
පිරිවැය ලාභාලාභ ගිණුම හර
අසාමාන්‍ය පාඩු ගිණුම බැර

උදාහරණ : 05

පෙරසැරි 3 ක් පසු කරන X නම් භාණ්ඩය පිළිබඳ පසුගිය සතියේ විස්තර මෙසේය.

	සමස්ථ පිරිවැය	**පෙරසැරි 1**	**පෙරසැරි 11**	**පෙරසැරි 111**
සෘජු ද්‍රව්‍ය	8,482	2,000	3,020	3,462
සෘජු වේතන	12,000	3,000	4,000	5,000
සෘජු වියදම්	726	500	226	-
නිෂ්පාදන පොදුකාර්ය	6,000			

ඒකකයක් රු. 5/= ක් වටිනා ඒකක 1,000 ක් අංක 1 පෙරසැරියට යොමුකළ අතර එක් එක් පෙරසැරියේ නිෂ්පාදනය මෙසේය.

අංක 1 පෙරසැරිය 920
11 පෙරසැරිය 870
111 පෙරසැරිය 800

සාමාන්‍ය අපතය සහ අපතයේ ඒකකයක් අලෙවි කරගත හැකි මිල මෙසේය.

අංක 1 පෙරසැරිය 10%, එකක් රු. 3 ක් ගණනේ
11 පෙරසැරිය 5%, එකක් රු. 5 ක් ගණනේ
111 පෙරසැරිය 10%, එකක් රු. 6 ක් ගණනේ

කිසිදු පෙරසැරියක ආරම්භක / අවසාන කෙරීගෙන යන වැඩ නොමැති සේ සලකා සියලු ගිණුම් සකස් කරන්න.

අවසාන නොනිමි තොග (Closing Work-in-Progress)

ඉහත පැහැදිලි කර පරිදි, පෙරසැරියක තොග යනු කෙරීගෙන යන වැඩ වේ.

කාලපරිච්ඡේදයක අග දිනට සම්පූර්ණ නොකළ ඒකක ඇත්නම්, ඒවා අවසාන නොනිමි වැඩ ලෙස පිළිගැනේ.

ඉහත නිදසුනේදී කළ උපකල්පනයක් වූයේ, ආරම්භක හා අවසාන නොනිමි ඒකක නොමැති බවයි. දැන් අපි සලකා බලනුයේ තාත්වික නිදසුන් වන අතර මෙහිදී, කාලපරිච්ඡේදයක් තුළදී දරන ලද පිරිවැය සම්පූර්ණ කළ ඒකක (එනම් නිමි නිෂ්පාදනය) සහ අසම්පූර්ණ ඒකක (එනම් නොනිමි නිෂ්පාදනය) අතර බෙදාදීම කරනුයේ කෙසේද යන්න පිළිබඳ අධ්‍යයනය කරන්නෙමු.

අභ්‍යාස 01

යම්කිසි කාලපරිච්ඡේදයක් තුළදී ඒකක 1,000 ක් පූර්ණ වශයෙන් ද තවත් ඒකක 200 ක් අර්ධ වශයෙන් ද නිමකළ බව උපකල්පනය කරන්න. ආරම්භක නොනිමි තොග නැත.

කාලපරිච්ඡේදය සඳහා දරන ලද පිරිවැය පහත පරිදි වූයේ නම් ඒකකයක පිරිවැය ගණනය කරන්න.

	රු.
මූලික අමුද්‍රව්‍ය	60,000
අතිරේඛ අමුද්‍රව්‍ය	10,000
ඍජු ශ්‍රමය	30,000
නිෂ්පාදන පොදුකාර්ය	10,000
	110,000

පිළිතුර

මුල්ම පියවර ලෙස කළ යුත්තේ, කාලපරිච්ඡේදය තුළදී කළ සම්පූර්ණ නිෂ්පාදනය තීරණය කිරීම සඳහා "සමානුපාතික ඒකක" ගණනය කිරීමයි.

සමානුපාතික ඒකක = භෞතික ඒකක x නිමකළ ප්‍රතිශතය

	භෞතික ඒකක	නිමි ප්‍රතිශතය (%)	සමානුපාතික ඒකක
පූර්ණ නිමි	1,000	100%	1,000
අවසාන නොනිමි	200	50%	100
	1,200		1,100

ඒකකයක පිරිවැය ගණනය කිරීම සඳහා, කාලපරිච්ඡේදය සඳහා වු මුළු පිරිවැය, සමානුපාතික ඒකක අතර බෙදාදිය යුතුය.

$$\textbf{ඒකකයක පිරිවැය} = \frac{\textbf{මුළු පිරිවැය}}{\textbf{මුළු සමානුපාතික ඒකක}}$$

ඉහත නිදසුනෙහි;

$$\text{ඒකකයක පිරිවැය} = \frac{110,000}{1,100}$$

= රු. 100

නොනිමි ඒකක, ඒ ඒ පිරිවැය මූලිකාංගයට අදාළව විවිධ මට්ටම් වලට සම්පූර්ණ වී තිබුනේ නම්, එය තව දුරටත් සංකීර්ණ වේ. මෙහිදී ද සමාන මූලධර්ම භාවිත කෙරේ. එනම් ඒ ඒ පිරිවැය මූලිකාංගය සඳහා සමානුපාතික ඒකක වෙන වෙනම හඳුනාගෙන, ඒකකයක පිරිවැය ද වෙන වෙනම හඳුනාගෙන අනතුරුව ඒවා එකතුකිරීම මගින් ඒකකයක මුළු පිරිවැය හඳුනාගැනේ.

අභ්‍යාස 02

දී ඇති කාලපරිච්ඡේදයක් සඳහා නිෂ්පාදන, තොග හා පිරිවැය දත්ත පහත පරිදි විය.

		රු.
මුළු පිරිවැයඃ		
මූලික අමුද්‍රව්‍ය	36,000	
අතිරේඛ අමුද්‍රව්‍ය		23,200
සෘජු ශ්‍රමය		22,800
නිෂ්පාදන පොදුකාර්ය		33,600
		115,600

තොග සහ නිෂ්පාදනය	**ඒකක**
ආරම්භක නොනිමි තොග	-
පූර්ණ නිමි ඒකක	10,000
අර්ධ නිමි අවසන් තොග	2,000

අවසන් නොනිමි ඒකක ඒ ඒ පිරිවැය මූලිකාංගයෙන් පහත පරිදි නිමවී තිබුණි.

මූලික අමුද්‍රව්‍ය	100%
අතිරේඛ අමුද්‍රව්‍ය	80%
සෘජු ශ්‍රමය	70%
නිෂ්පාදන පොදුකාර්ය	60%

ඔබ කළ යුතු වන්නේ,

(1) සමානුපාතික නිෂ්පාදනය ගණනය කිරීම.

(2) නිමකළ ඒකකයක පිරිවැය

(3) අවසන් නොනිමි ඒකක වල පිරිවැය

පිළිතුර :

(1) සහ (2) සමානුපාතික ඒකක ප්‍රකාශය

පිරිවැය මූලිකාංගය	සමානුපාතික ඒකක			මුළු පිරිවැය (රු.)	ඒකකයක පිරිවැය (රු.)	
	නොනිමි	පූර්ණ නිමි	මුළු			
මූලික අමුද්‍රව්‍ය	2,000 x 100% = 2,000	10,000	12,000	36,000	36,000 ÷ 12,000 =	3
අතරේබ අමුද්‍රව්‍ය	2,000 x 80% = 1,600	10,000	11,600	23,200	23,200 ÷ 11,600 =	2
ඍජු ශ්‍රමය	2,000 x 70% = 1,400	10,000	11,400	22,800	22,800 ÷ 11,400 =	2
නිෂ්. පො/කා	2,000 x 60% = 1,200	10,000	11,200	33,600	33,600 ÷ 11,200 =	3
				115,600		10

(3) **අවසන් නොනිමි තොගයේ වටිනාකම (පිරිවැය) :**

මූලික අමුද්‍රව්‍ය	- 2,000 x 100% x 3	=	6,000
අතිරේබ අමුද්‍රව්‍ය	- 2,000 x 80% x 2	=	3,200
ඍජු ශ්‍රමය	- 2,000 x 70% x 2	=	2,800
නිෂ්. පො/කා	- 2,000 x 60% x 3	=	3,600
			15,600

හෝ

අවසන් නොනිමි තොගයේ පිරිවැය = මුළු පිරිවැය - පූර්ණ නිමි ඒකක වල පිරිවැය

= 115,600 – (10,000 x 10/=)

= 15,600

සටහන් :

- යම් පෙරසැරියක කටයුතු පටන්ගැනීම සඳහා ආරම්භයේදී යොදන අමුද්‍රව්‍ය මූලික අමුද්‍රව්‍ය හෙවත් යෙදවුම් අමුද්‍රව්‍ය වේ. යම් පෙරසැරියක නිමවුම, ඊළඟ පෙරසැරියේ මූලික අමුද්‍රව්‍ය වේ. සාමාන්‍යයෙන් නොනිමි ඒකක වුවද මූලික අමුද්‍රව්‍ය වලින් 100% ක් නිමි ලෙස ගැනේ.

- මූලික අමුද්‍රව්‍ය වලට අමතරව, පෙරසැරිය කෙරීගෙන යන අතරතුරදී යොදන අමුද්‍රව්‍ය අතිරේබ අමුද්‍රව්‍ය වේ. නොනිමි ඒකක මෙම අමුද්‍රව්‍ය වලින් පූර්ණ ලෙස හෝ අර්ධ ලෙස නිමවී තිබිය හැක.

ආරම්භක නොනිමි තොග (Opening Work-in-progress)

යම් කාලපරිච්ඡේදයක අග දිනට නොනිමි ඒකක තිබුනේ නම්, එය ඊළඟ කාලපරිච්ඡේදයේ ආරම්භක කෙරීගෙන යන වැඩ වේ. බොහෝ ප්‍රායෝගික අවස්ථාවන්හිදී පෙරසැරියක් තුළ ආරම්භක මෙන්ම අවසාන නොනිමි ඒකක ද ඇත.

සාමාන්‍යයෙන් කාලයෙන් කාලයට පිරිවැය වෙනස් වන නිසා, ඒ ඒ නිෂ්පාදන කාණ්ඩයට අදාළ ඒකකයක පිරිවැය ද වෙනස් වේ. ආරම්භක නොනිමි ඒකක සඳහා සමානුපාතික නිෂ්පාදනය ගණනය කරන ආකාරය තීරණය වන්නේ, භාවිතා කරන පිරිවැයකරණ ක්‍රමය මතය.
ප්‍රායෝගික භාවිතයේ පවතින පිරිවැයකරණ ක්‍රම 2 කි.

(1) මුලින් ලැබීම් මුලින් පිටවන ක්‍රමය (First – In – First - Out / FIFO)
(2) බරතැබූ සාමාන්‍ය ක්‍රමය (Average Cost Method /AVCO)

FIFO ක්‍රමය

නව කාලපරිච්ඡේදයේදී ආරම්භක නොනිමි ඒකක මුලින්ම සම්පූර්ණ කරන බවත්, ඊළඟට පෙරසැරියට කළ යෙදවුම් අනතුරුව සම්පූර්ණ කරන බවත් මෙහිදී උපකල්පනය කෙරේ. මෙහිදී වර්තමාන කාලපරිච්ඡේදයේ අවසාන නොනිමි ඒකක ලෙස ඉතිරිවන්නේ, කාලය තුළ යෙදවුම් කළ නමුත් අවසන් කිරීමට නොහැකි වූ ඒකක වේ.

අභ්‍යාස 03

	ඒකක
සෑම අතින්ම 70% ක් නිමි ආරම්භක නොනිමි	2,000
නිමි තොගයට මාරුකළ	5,000
සෑම අතින්ම 50% ක් නිමි අවසන් නොනිමි	3,000

කාලපරිච්ඡේදය සඳහා සමානුපාතික ඒකක ගණනය කරන්න.

පිළිතුර :

	ඒකක
ආරම්භක නොනිමි නිම කිරීම (2,000 x 30%)	600
කාලය තුළ පටන්ගත් හා නිමකළ (3,000 x 100%)	3,000
අවසන් නොනිමි ඒකක (3,000 x 50%)	1,500
∴ සමානුපාතික නිෂ්පාදනය	5,100

බරතැබූ සාමාන්‍ය ක්‍රමය (Average Cost Method / AVCO Method)

මෙහිදී, FIFO ක්‍රමයේදී මෙන්, නව කාලපරිච්ඡේදයේදී ආරම්භක නොනිමි ඒකක මුලින්ම නිමකරන බවටත් ඊළඟ යෙදවුම් අනතුරුව නිමකරන බවටත් කළ උපකල්පනය මත පිරිවැයකරණය ආරම්භ නොවේ. ඒ වෙනුවට සියලුම ඒකක, නිෂ්පාදනයේදී එකට සැලකිල්ලට ගන්නා බව පිළිගැනේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ආරම්භක නොනිමි තොගයේ පිරිවැය, කාලය තුළ යෙදවූ හා නිමවූ ඒකක වල පිරිවැයෙන් වෙන් කිරීමක් සිදුනොකරන අතර, ඒවාට, මිශ්‍ර වීමට ඉඩ සැලසේ. ඒවායේ මුළු පිරිවැය, මිශ්‍ර වූ සමස්ථ ඒකක වලින් බෙදා ඒකකයක බර තැබූ සාමාන්‍ය පිරිවැය තීරණය කෙරේ.

අභ්‍යාස 04

2014 පෙබරවාරි මාසය සඳහා නිෂ්පාදන ආයතනයක පෙරසැරියකට අදාළව දී ඇති පහත තොරතුරු වලින්,

(1) සමානුපාතික ඒකක හා පිරිවැය ප්‍රකාශය
(2) පෙරසැරි ගිණුම

සකස් කරන්න.

නිෂ්පාදන හා තොග වාර්තා :

- 2014/02/01 දිනට පෙරසැරිය තුළ තිබූ ඒකක (ද්‍රව්‍ය පූර්ණ ලෙස භාවිතා කළ හා ශ්‍රමය හා පොදුකාර්ය වලින් 25% ක් සම්පූර්ණ) — 4,000
- පෙබරවාරි මාසය තුළ හඳුන්වා දුන් ඒකක — 16,000
- මාසය තුළ නිමකළ ඒකක — 14,000
- 2014/02/28 දිනට පෙරසැරිය තුළ තිබූ ඒකක (ද්‍රව්‍ය පූර්ණ ලෙස භාවිතා කළ හා ශ්‍රමය හා පොදුකාර්ය වලින් $33\frac{1}{3}\%$ ක් සම්පූර්ණ) — 6,000

පිරිවැය වාර්තා :

- 2014/02/01 දිනට ආරම්භක නොනිමි තොග

	රු.
ද්‍රව්‍ය	6,000
ශ්‍රමය	1,000
පොදුකාර්ය	1,000
	8,000

- මාසය සඳහා පිරිවැය

ද්‍රව්‍ය	25,600
ශ්‍රමය	15,000
පොදුකාර්ය	15,000
	55,600

- නිෂ්පාදනය තුළ අපතයක් බලාපොරොත්තු නොවූ අතර, සත්‍ය අපතයක් ද ඇති නොවුනි.

පිළිතුර :

(1) සමානුපාතික ඒකක හා පිරිවැය ප්‍රකාශය

සත්‍ය නිෂ්පාදනය				සමානුපාතික නිෂ්පාදනය					
යෙදවුම්		නිමවුම්		ද්‍රව්‍ය		ශ්‍රමය		පොදුකාර්ය	
	ඒකක		ඒකක	%	ඒකක	%	ඒකක	%	ඒකක
ආර/නොනිමි	4,000	පූර්ණ නිමි	14,000	100	14,000	100	14,000	100	14,000
යෙදවුම්	16,000	අව/නොනිමි	6,000	100	6,000	$33\frac{1}{3}$	2,000	$33\frac{1}{3}$	2,000
	20,000		20,000						
					20,000		16,000		16,000
		පිරිවැය							
		ආරම්භක නොනිමි			6,000		1,000		1,000
		මාසය තුළ දරන ලද			25,600		15,000		15,000
		මුළු පිරිවැය (දළ / ශුද්ධ)			31,600		16,000		16,000
		සමානුපාතික ඒකකයක පිරිවැය	3.58		1.58		1		1
		අගය කිරීම							
		පූර්ණ නිමි නිෂ්පාදනය	50,120		22,120		14,000		14,000
		අවසන් නොනිමි	13,480		9,480		2,000		2,000
			63,600						

(2) පෙරසැරි ගිණුම

ඉ/ගෙ	4,000		8,000	නිමි තොගයට මාරු	14,000	3.58	50,120
ද්‍රව්‍ය	16,000		25,600	ප/ගෙ	6,000		13,480
ශ්‍රමය			15,000				
පොදුකාර්ය			15,000				
	20,000		63,600		20,000		63,600

සේවා පිරිවැයකරණය
SERVICE COSTING

සේවා පිරිවැයකරණය හෙවත් මෙහෙයුම් පිරිවැයකරණය යනු අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයකරණයට අයත් තවත් පිරිවැයකරණ ක්‍රමයකි.

මේ දක්වා, මෙම පරිච්ඡේදය තුළ අප අධ්‍යයනය කර ඇත්තේ, නිෂ්පාදන ආයතන විසින් භාවිතකරන විවිධ වු පිරිවැයකරණ ක්‍රම පිළිබඳවයි. අප මේ දක්වා සොයා බැලූ බොහෝ පිරිවැය ගිණුම්කරණ මූලධර්ම, සේවා ආයතන වලටද අදාළ කරගත හැක.

මෙහිදී අප අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වන්නේ, සේවා ආයතන විසින් භාවිතා කරන පිරිවැයකරණ ක්‍රම පිළිබඳවයි. ඒවා සේවා පිරිවැයකරණය නම් වේ.

මෙලෙස සපයන සේවාවන්, මහජන ප්‍රවාහනය, හෝටල් කර්මාන්තය, සෞඛ්‍ය සේවාව, විදුලි බලය ජනනය, භෝජනාගාර වැනි බාහිර සේවාවන් මෙන්ම, ආපනශාලා, නඩත්තු, ගබඩාව, මිලට ගැනීම් අංශය වැනි අභ්‍යන්තර සේවාවන් ද විය හැක.

මෙහිදී මුහුණදෙන දුෂ්කර කාර්යයක් වන්නේ පිරිවැය ගණනය කිරීම සඳහා වු පිරිවැය ඒකකයක් තීරණය කිරීම පිළිබඳවයි. **"සංයුක්ත පිරිවැය ඒකකය"** යන සංකල්පය වඩාත් අදාළ මෙන්ම තාර්කික වේ.

සංයුක්ත පිරිවැය ඒකකය (Composite Cost Unit)

ඉහත උප ඒකකයක් තුළ දැනටමත් පැහැදිලි කර ඇති පරිදි, යම් පිරිවැය ඒකකයක් කොටස් දෙකක් හෝ වැඩි ගණනකින් සමන්විත වේ නම් "සංයුක්ත පිරිවැය ඒකකය" සංකල්පය අදාළ වේ. එනම් පිරිවැය ඒකකයක්, උප ඒකක දෙකක් හෝ කිහිපයක එකතුවකි.

උදාහරණ :

සේවා කර්මාන්තය	භාවිත කළ හැකි සංයුක්ත පිරිවැය ඒකකය
මගී ප්‍රවාහනය	එක් මගියෙකුට - කිලෝමීටරයක්
භාණ්ඩ ප්‍රවාහනය	ටොන් එකක් - කිලෝමීටරයක්
රෝහල්	එක් ලෙඩෙක් - දිනක්
විදුලි බල සැපයුම	කිලෝවොට් පැය (KWH)
ආපන ශාලා	එක් පුද්ගලයෙකුට - එක වේලක්
සිනමා ශාලාවක්	එක් පුද්ගලයෙකුට - එක දර්ශන වාරයක්
ගෑස්	නිපදවන ඝන අඩි 1,000 ක්
නවාතැන්පලක්	එක් පුද්ගලයෙකුට - එක දිනක්

සේවා පිරිවැයකරණයේ ප්‍රධානම ලක්ෂණයක් වන්නේ, බොහෝ පිරිවැය ඒවායේ ස්වභාවයෙන්ම ස්ථාවර වේ. නිදසුනක් ලෙස, සිනමා ශාලාවක මෙහෙයුම් පිරිවැය, ප්‍රේක්ෂකයන්ගේ ගණන මත තීරණය නොවේ.

සේවා අංශයේ නියැලෙන සෑම ආයතනයක්ම පිරිවැයකරණයේදී ප්‍රවේශමෙන් තීරණය කළ යුතු දෙයක් වන්නේ, තම පරමාර්ථයන් සඳහා වඩාත් යෝග්‍ය වන පිරිවැය ඒකකය කුමක්ද යන්නයි. කුමන ආකාරයක පිරිවැය ඒකකයක් හඳුන්වා දුන්නද, ඒකකයක පිරිවැය පහත පරිදි ගණනය කෙරේ.

$$\text{ඒකකයක පිරිවැය} = \frac{\text{කාලපරිච්ඡේදයේ මුළු පිරිවැය}}{\text{කාලපරිච්ඡේදය තුළ සැපයූ මුළු සේවා ඒකක}}$$

අභ්‍යාස 01

"කලම්බු රයිඩර් ට්‍රාන්ස්පෝර්ට්" (CRT) යනු මගී ප්‍රවාහනය සඳහා බස්රථ සමූහයක් යොදවා ඇති, සුළු පරිමාණ ප්‍රවාහන සමාගමකි. ඔවුන්ගේ පොත් වලින් උපුටාගත් පහත තොරතුරු වලින්, ධාවනය කළ කිලෝමීටර් ගණන හා මගී කිලෝමීටර් ගණන සොයන්න.

බස්රථ ගණන	:	4
මාසයකට වැඩකරන දින ගණන	:	30
බස්රථයක් ධාවනය වන වාර ගණන	:	4 (දිනකට)
මාර්ගයේ දුර	:	කිලෝමීටර 30 (එක් දිශාවකට)
බස්රථයක ධාරිතාව	:	මගීන් 60
ගමන් කරන මගීන්ගේ සාමාන්‍යය	:	ධාරිතාවයෙන් 80%

පිළිතුර :

ආවරණය කළ මුළු කිලෝමීටර් ගණන :

= බස්රථ ගණන x දින ගණන x වාර ගණන x ගමන්වාරයක දුර

= 4 x 30 x 4 x 60

= <u>කි.මී. 28,800</u>

ආවරණය කළ මුළු මගී කිලෝමීටර් ගණන :

$$= 28,800 \times 60 \times \frac{80}{100}$$

= <u>1,382,400 (මගී කි.මී.)</u>

අභ්‍යාස 02

ලොරි සමූහයක් පවත්වා ගනිමින් ප්‍රවාහන සේවා සපයන සමාගමකට අදාළ මාසයක් සඳහා වූ තොරතුරු පහත පරිදි වේ.

මාසය තුළ ධාවනය කළ කි. මීටර ගණන	30,000
මාසය සඳහා වැටුප් (රු.)	60,000
ගරාජ කුලී (රු.)	30,000
ඩීසල් හා තෙල්..... වැනි වියදම් (රු.)	120,000
ඉඩදිය හැකි වාර්ෂික ක්ෂය (පිරිවැය මත)	25%
ලොරිවල මූලික පිරිවැය (රු.)	6,000,000
මාසය සඳහා අලුත්වැඩියා වියදම් (රු.)	360,000
වාර්ෂික බලපත්‍ර, රක්ෂණ ගාස්තු (රු.)	360,000

එක් ධාවන කිලෝමීටරයක් සඳහා විචල්‍ය හා ස්ථාවර ගාස්තුව පෙන්වමින්, 2014 අප්‍රේල් මාසය සඳහා ප්‍රකාශනයක් සකස් කරන්න.

පිළිතුර :

2014 අප්‍රේල් සඳහා මෙහෙයුම් පිරිවැය ප්‍රකාශය

ධාවනය කළ කිලෝමීටර් ගණන : 30,000		
	රු.	**කි.මී. ට (රු.)**
ස්ථාවර වියදම් :		
වැටුප්	60,000	
ගරාජ කුලී	30,000	
බලපත්‍ර, රක්ෂණ වැනි (360,000 / 12)	30,000	
ක්ෂය $\left(6{,}000{,}000 \times 25\% \times \frac{1}{12}\right)$	125,000	
	245,000	8.17
විචල්‍ය පිරිවැය :		
ඩීසල්, තෙල් වැනි	120,000	
අලුත්වැඩියා	360,000	
	480,000	16
මුළු පිරිවැය	**725,000**	**24.17**

"අතුරු නිෂ්පාදන හා බද්ධ නිෂ්පාදන" (By Products and Joint Products)

අභ්‍යාස 03 (පිළිතුරු රහිත)

සමාගමක් බද්ධ නිෂ්පාදන තුනක් සහ එක් අතුරු නිෂ්පාදනයක් සකස් කරයි. සම්පූර්ණයෙන්ම සකස් කිරීමෙන් පසුව භාණ්ඩ ඒකකයක් අලෙවි කර ගත හැකි මිල මෙසේය.

බද්ධ නිෂ්පාදන	ඒ	රු. 17
එම	බී	රු. 13
එම	සී	රු. 36
අතුරු නිෂ්පාදන	ඩී	රු. 9

එම භාණ්ඩ සම්පූර්ණයෙන්ම සකස් නොකරන්නේ නම් අලෙවි කරගත හැකි මිල මෙසේය.

ඒ - රු. 8 බී - රු. 4 සී - රු. 10 ඩී - රු. 2

සම්පූර්ණයෙන්ම පිරිපහදු කිරීමේ අතිරේක පිරිවැය

ඒ - රු. 7 බී - රු. 5 සී - රු. 18 ඩී - රු. 8

නිෂ්පාදිත ප්‍රතිශත

ඒ - 40% බී - 30% සී - 20% ඩී - 10%

පසුගිය මාසයේ පෙරසැරි කළ මූලික අමුද්‍රව්‍ය ප්‍රමාණය කිලෝ 100,000 ක් වූ අතර කිලෝවක මිල රු. 4 ක් විය. පැයක වැටුප රු. 1.20 වු අතර පැය 100,000 ක ශ්‍රමය යොදාගන්නා ලදී.

එක් එක් භාණ්ඩයේ ඒකකයක පිරිවැය සකස් කරන්න.

ප්‍රශ්න බැංකුව
Question Bank

ප්‍රශ්න අංක 01 (පිළිතුරු සහිත)

පහත දී ඇති තොරතුරු, එන්ජින් ප්‍රතිසංවර්ධනය (Engine re-borring) කිරීමේ නියැලෙන PLC සමාගමේ කාර්යය අංක 826 ට අදාළ පිරිවැය වාර්තා වලින් උපුටා ගෙන ඇත.

කාර්යය සඳහා නිකුත් කළ ද්‍රව්‍ය		රු. 9,356
ගබඩාවට හරහා එවූ ද්‍රව්‍ය		රු. 612
සෘජු වැටුප්	-	පරීක්ෂා කිරීමේ අංශය : රු. 150 බැගින් පැය 3
	-	කොටස් වෙන්කිරීමේ අංශය : රු. 200 බැගින් පැය 2
	-	එක් කිරීමේ අංශය : රු. 300 බැගින් පැය 6

රු. 2,200 ක පිරිවැයක් දරා, මෙම කාර්යය සඳහා විශේෂ රත් කිරීමේ යන්ත්‍රයක් කුලියට ලබාගෙන ඇත.

පහත සඳහන් අනුපාත මත, නිෂ්පාදන පොදුකාර්ය අන්තර්ග්‍රහණය කළ යුතු වේ.

පරීක්ෂා කිරීමේ අංශය	:	සෘජු ශ්‍රම පැයකට රු. 200 බැගින්
කොටස් වෙන්කිරීමේ අංශය	:	සෘජු ශ්‍රම පිරිවැය මත 200 බැගින්
එක් කිරීමේ අංශය	:	සෘජු ශ්‍රම පැයකට රු. 100 බැගින්

(1) කාර්යය අංක 826 ට අදාළ මුළු පිරිවැය ගණනය කරන්න.

(2) සමාගමේ මිල කිරීමේ ප්‍රතිපත්තිය මුළු පිරිවැයට 30% ක් තබාගැනීම නම්, විකුණුම් මිල ගණනය කරන්න.

ප්‍රශ්න අංක 02 (පිළිතුරු සහිත)

සීමිත හයිරූ නේවල් ක්‍රාෆ්ට් ඉංජිනියරින් (පෞද්ගලික) සමාගම මධ්‍යම ප්‍රමාණයේ නාවික යාත්‍රා අළුත්වැඩියා කටයුතුවල නියැලෙන සමාගමක් වන අතර එම කටයුතු වල පිරිවැය සෙවීම සඳහා කාර්යය පිරිවැයකරණය භාවිත කෙරේ. පහත දී ඇති විස්තර, 2014 ඔක්තෝබර් මාසය තුළදී ඉටුකරන ලද කාර්යයන් වලට අදාල වේ.

	රු. මිලියන
ආරම්භක තොග (2014/10/01 දිනට)	
අමුද්‍රව්‍ය – A	12
අමුද්‍රව්‍ය – B	8
වක්‍ර ද්‍රව්‍ය	20
	40
නිමි තොග - කාර්යය P	120
කෙරීගෙන යන - කාර්යය Q	24

2014 ඔක්තෝබර් මාසය තුළදී පහත සඳහන් ගණුදෙනු සිදු වී ඇත.

(i) ද්‍රව්‍ය මිලට ගැනීම්	රු. මිලියන
අමුද්‍රව්‍ය – A	40
අමුද්‍රව්‍ය – B	40
වක්‍රද්‍රව්‍ය	50
	130

(ii) නිෂ්පාදනය සඳහා නිකුත් කළ ද්‍රව්‍ය

	රු. මිලියන	
	කාර්යය Q	**කාර්යය R**
අමුද්‍රව්‍ය – A	20	11
අමුද්‍රව්‍ය – B	16	12
	36	23

මාසය තුලදී රු. මිලියන් 40 ක් වටිනා වක්‍ර ද්‍රව්‍ය නිකුත් කර ඇත.

(iii) කර්මාන්තශාලා ශ්‍රමය

	කාර්යය Q	**කාර්යය R**
රු. මිලියන	56	16

මාසය සඳහා අදාල වක්‍ර ශ්‍රම පිරිවැය රු. මිලියන 30 කි.

(iv) මාසය සඳහා දරන ලද අනෙකුත් කම්හල් පොදුකාර්ය

	රු. මිලියන
පිරියත X	80
පිරියත Y	40
	120

(v) ස්ථාවර කම්හල් පොදුකාර්ය පහත සඳහන් පූර්ව නිශ්චිත අනුපාත මත ඒ ඒ කාර්යයට අයකල යුතු වේ.

පිරියත X - යන්ත්‍ර පැයකට රු. 30,000 බැගින්
පිරියත Y - යන්ත්‍ර පැයකට රු. 24,000 බැගින්

(vi) ඔක්තෝබර් මාසය තුලදී ඒ ඒ කාර්යය සඳහා වැය වූ යන්ත්‍ර පැය ගණන් පහත පරිදි විය.

	පිරියත X (යන්ත්‍ර පැය)	**පිරියත Y (යන්ත්‍ර පැය)**
කාර්යය Q	2,000	1,400
කාර්යය R	1,500	1,200

(vii) කාර්යය Q මාසය තුලදී නිම වූ අතර, කාර්යය R 2014 ඔක්තෝබර් 31 දින වන විටත් නොනිමි තත්වයේ පැවතුණි.

(viii) 2014 ඔක්තෝබර් 1 දින වන විටත් නිම කොට තිබූ කාර්යය P, නිෂ්පාදන පිරිවැය මත වූ 125% ක ලාභ අධිකයක් තබාගෙන මාසය තුලදී නැව අයිතිකරුට බාරදෙනු ලැබීය.

ඔක්තෝබර් මාසය තුලදී නිම වූ කාර්යය Q ද, සමාන ලාභ අධිකයක් තබාගෙන අදාළ ගණුදෙනුකරුට බාරදීමට නියමිතය.

ඔබ විසින් කල යුතු වන්නේ,

(a) ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය විචලනය ගණනය කරන්න.
(b) ඉහත විචලනය පිරිවැය ගිණුම්වල ගලපන ආකාරය පැහැදිලි කරන්න.
(c) කාර්යය Q ට අදාල මුළු නිෂ්පාදන / කම්හල් පිරිවැය ගණනය කරන්න.
(d) කාර්යය R හි කෙරීගෙන යන වැඩ වටිනාකම ගණනය කරන්න.
(e) 5% ක් වූ විශේෂ වට්ටමකට යටත්ව කාර්යය Q විකිණීමට සිදු වූයේ නම්, එහි දළ ලාභය සොයන්න.

ප්‍රශ්න අංක 03 (පිළිතුරු සහිත)

පහත දී ඇති සංඛ්‍යා තනි නිෂ්පාදන ක්‍රියාවලියකට අදාල වේ. කාල පරිච්ඡේදයේ ආරම්භක දිනට තිබූ කෙරීගෙන යන ඒකක 1,000 කි.

ආරම්භක නොනිම් ඒකකවල වටිනාකම		රු.
අමුද්‍රව්‍ය	I	3,900
අමුද්‍රව්‍ය	II	750
ඍජු ශ්‍රමය		1,120
පොදුකාර්ය		1,180
		6,950

සලකා බලන කාල පරිච්ඡේදය තුලදී, තවදුරටත් ඒකක 6,000 ක් පෙරසැරියට යොමුකල අතර ඒවායේ පිරිවැය රු. 23,600 කි.

අනෙකුත් පිරිවැයඃ

		රු.
අමුද්‍රව්‍ය	II	5,200
ඍජු ශ්‍රමය		10,360
පොදුකාර්ය		15,410

නිමි තොගයට මාරුකල ඒකක : 4,700

කළමනාකරණය අපේක්ෂා කරන අපතය ක්‍රියාකාරී ඒකක වලින් 5% ක් වන අතර, අපතේ යන ඒකකයක් රු. 2.00 බැගින් විකිණිය හැක.

මාසය තුලදී ඒකක 300 ක් අපතේ ගිය අතර ඒවා පහත පරිදි නිව වී තිබුණි.

අමුද්‍රව්‍ය	II	100%
ඍජු ශ්‍රමය		80%
පොදුකාර්ය		60%

අවසාන තොගය ඒකක 2,000 ක් වූ අතර ඒවා පහත පරිදි නිව වී තිබුණි.

අමුද්‍රව්‍ය	II	60%
ඍජු ශ්‍රමය		50%
පොදුකාර්ය		40%

ඔබ කල යුතු වන්නේ,

(i) බර තැබූ සාමාන්‍ය ක්‍රමයට, "සමානුපාතික ඒකක හා පිරිවැය ප්‍රකාශය" සකස් කොට ඒකකයක පිරිවැය ගණනය කිරීම.

(ii) පෙරසැරි ගිණුම හා අදාල අනෙකුත් ගිණුම් සකස් කිරීම.

පිළිතුරු :

(1) **පිරිවැය හා ලාභ විශ්ලේෂණය - කාර්යය අංකය 826**

	රු.	රු.
පාවිච්චි කල ද්‍රව්‍ය (9,356 – 612)		8,744
සෘජු වේතන :		
පරීක්ෂා කිරීමේ (3 x රු. 150)	450	
වෙන්කිරීමේ (2 x රු. 200)	400	
එක් කිරීමේ (6 x රු. 300)	1,800	2,650
අනෙකුත් සෘජු වියදම් (කුලී)		2,200
∴ මුළු සෘජු පිරිවැය		13,594
(+) නිෂ්පාදන පොදුකාර්යය		
වේතන (රු. 200 x 3)	600	
වෙන්කිරීම් (රු. 400 x 200%)	800	
එක්කිරීමේ (රු. 100 x 6)	600	2,000
∴ මුළු පිරිවැය		15,594
(+) ලාභ අධිකය (15,594 x 30%)		4,678.20
∴ කාර්යයේ විකුණුම් මිල		20,272.20

(2)

(a) **අන්තර්ග්‍රහණය වන ස්ථාවර කම්හල් පොදුකාර්ය:**

					රු. මිලි.	රු. මිලි.
කාර්යය	Q	- පිරියත X	(30,000 x 2,000)	=	60	
		- පිරියත Y	(24,000 x 1,400)	=	33.6	93.6
කාර්යය	R	- පිරියත X	(30,000 x 1,500)	=	45	
		- පිරියත Y	(24,000 x 1,200)	=	28.8	73.8
						167.4

දරන ලද මුළු ස්ථාවර කම්හල් පොදුකාර්ය:

		රු. මිලියන
වක්‍ර ද්‍රව්‍ය	=	40
වක්‍ර ශ්‍රමය	=	30
අනෙකුත් කම්හල් පොදුකාර්ය	=	120
මුළු කම්හල් පොදුකාර්ය	=	190

∴ කම්හල් පොදුකාර්ය ඌණ අන්තර්ග්‍රහණය = 167.4 – 190

= රු. මිලියන 22.6

(b) **ගිණුම්කරණ බලපෑම**

රු. මිලියන 22.6 ක් වූ කම්හල් පොදුකාර්ය ඌණ අන්තර්ග්‍රහණය, වියදමක් සේ සලකා ලාභාලාභ ගිණුමට අයකල යුතුය.

(c) **කාර්යය Q හි මුළු නිෂ්පාදන පිරිවැය**

			රු. මිලියන
2014/10/01 දිනට නිෂ්පාදන පිරිවැය			24
ඔක්තෝබර් මාසය තුලදී දරන ලද පිරිවැයඃ			
අමුද්‍රව්‍ය	36		
සෘජු ශ්‍රමය	56	92	
අන්තර්ග්‍රහණය කල කම්හල් පො/කා.		93.6	185.6
∴ මුළු නිෂ්පාදන පිරිවැය			209.6

(d) **කාර්යය R ට අදාල නොනිමි වැඩ වටිනාකම**

	රු. මිලියන
අමුද්‍රව්‍ය	23
සෘජු ශ්‍රමය	16
මුළු සෘජු පිරිවැය	39
(+) අන්තර්ග්‍රහණය කල කම්හල් පො/කා.	73.8
2014/10/31 දිනට නොනිමි වැඩ වටිනාකම	112.8

(e) **කාර්යය Q හි දළ ලාභය**

	රු. මිලියන
නිෂ්පාදන පිරිවැය	209.6
(+) ලාභ ආන්තිකය (209.6 @ 25%)	52.4
විකුණුම් මිල	262
(-) වට්ටම් (262 x 5%)	13.1
විකුණුම් මිල (වට්ටමට පසු)	248.9
(-) නිෂ්පාදන පිරිවැය	(209.6)
∴ දළ ලාභය	39.3

(3)

(i) **සමානුපාතික ඒකක හා පිරිවැය ප්‍රකාශය (AVCO ක්‍රමය)**

සත්‍ය ඒකක				සමානුපාතික ඒකක							
යෙදවුම්		නිමවුම්		අමුද්‍රව්‍ය 1		අමුද්‍රව්‍ය 11		සෘජු ශ්‍රමය		පො/කා	
	ඒකක		ඒකක	%	ඒකක	%	ඒකක	%	ඒකක	%	ඒකක
ආර/තොග	1,000	සාමා. අපතය	250	-	-	-	-	-	-	-	-
කාලය තුල යෙදවුම්	6,000	අසා. අපතය	50	100	50	100	50	80	40	60	30
		නිමි. මාරු	4,700	100	4,700	100	4,700	100	4,700	100	4,700
		අව/තොග	2,000	100	2,000	60	1,200	50	1,000	40	800
	7,000		7,000								
					6,750		5,950		5,740		5,530
පිරිවැය :											
ආරම්භක නොනිමි ඒකක වල					3,900		750		1,120		1,180
කාලය තුල දරන ලද					23,600		5,200		10,360		15,410
මුළු පිරිවැය (දළ)					27,500		5,950		11,480		16,590
(-)සාමා.අපතයේ සුන්බුන් අගය(250 x 2)					(500)		-		-		-
මුළු පිරිවැය (ශුද්ධ)					27,000		5,950		11,480		16,590
∴ ඒකකයක පිරිවැය			10		4		1		2		3
අගය කිරීම :											
අසාමාන්‍ය අපතය			420		200		50		80		90
නිමි. මාරුකල ඒකක			47,000		18,800		4,700		9,400		14,100
අව. තොගය			13,600		8,000		1,200		2,000		2,400

සටහන් :

(1) අපතයන් :

	ඒකක
ආරම්භක නොනිමි	1,000
(+) කාලය තුල යෙදවුම්	6,000
	7,000
(-) අවසන් නොනිමි	(2,000)
∴ ක්‍රියාකාරී ඒකක	5,000

∴ සාමාන්‍ය අපතය (5,000 x 5%)	=	250
සත්‍ය අපතය	=	300
∴ අසාමාන්‍ය අපතය	=	50

සාමාන්‍යයෙන් මූලික අමුද්‍රව්‍ය (අමුද්‍රව්‍ය 1) පෙරසැරියට හඳුන්වා දෙනුයේ ආරම්භයේදී නිසා, සෑම ඒකකයක්ම මූලික අමුද්‍රව්‍ය වලින් 100% ක් නිමි බව පැහැදිලි වේ.

(ii) **පෙරසැරි ගිණුම**

ඉ/ශෙ	1,000		6,950	සාමා. අපතය	250	2	500
යෙදවුම් - අමු 1	6,000		23,600	අසා. අපතය	50		420
යෙදවුම් - අමු 11			5,200	නිමි තොගයට මාරු	4,700	10	47,000
සෘජු ශ්‍රමය			10,360	ප/ශෙ	2,000		13,600
පොදුකාර්ය			15,410				
	7,000		61,520		7,000		61,520

සාමාන්‍ය අපතය

පෙරසැරි	250	2	500				
අසාමාන්‍ය අපතය	50	2	100	මුදල්	300	2	600
	300		600		300		600

අසාමාන්‍ය අපතය

පෙරසැරි	50		420	සාමා. අපතය	50	2	100
				පිරිවැය ලා/ලා			320
	50		420		50		420

අභ්‍යාස (පිළිතුරු රහිත)

ප්‍රශ්න අංක 01
"කේ" නම් භාණ්ඩය එක් ක්‍රියාවලියකින් අවසන් කරනු ලැබේ. ජනවාරි මාසය ආරම්භයේ මෙම ක්‍රියාවලියේ කෙරීගෙන යන ඒකක නොතිබිණි. ජනවාරි මාසයේ ක්‍රියාවලිය හා සම්බන්ධ ඒකක මෙසේය.

ක්‍රියාවලියට එක් කරන ලද ඒකක 12,000 පිරිවැය රු. 34,850
ඉවත දැමූ ඒකක 1,250

ඉවත දැමූ ඒකකයක් පහත සඳහන් පරිදි නිම වී තිබුණි.

අමුද්‍රව්‍ය	80%
ශ්‍රමය	70%
පොදුකාර්ය	70%

ඉවත දමන ඒකකයක් රු. 2.00 ක් ගණනේ විකිණිය හැකිය. මාසය තුළදී ඒකක 10,250 ක් සම්පූර්ණයෙන්ම නිමවන ලදී.

කාලය තුළ අනෙකුත් පිරිවැය මෙසේය.

අමුද්‍රව්‍ය	21,360
ශ්‍රමය	10,620
පොදුකාර්ය	31,860

අවසන් තොගය ඒකක 500 ක් විය. තොගයේ ඒකකයක් පහත සඳහන් පරිදි නිමවී තිබිණි.

අමුද්‍රව්‍ය	70%
ශ්‍රමය	60%
පොදුකාර්ය	60%

මෙම ක්‍රියාවලියේ සාමාන්‍ය අපතේ යාම 10% කි. ක්‍රියාවලි ගිණුම් සකස් කරන්න.

ප්‍රශ්න අංක 02
"කේ" භාණ්ඩය පිළිබඳ පෙබරවාරි මාසයේ විස්තර මෙසේය. මාසය ආරම්භයේ කෙරීගෙන යන ඒකක 500 කි. පිරිවැය රු. 3,400 කි. මෙම ඒකක පහත සඳහන් පරිදි නිම වී තිබුණි.

අමුද්‍රව්‍ය	70%
ශ්‍රමය	60%
පොදුකාර්ය	60%

ක්‍රියාවලියට ඇතුලත් කළ ඒකක 15,000 පිරිවැය රු. 43,600
ඉවත දැමූ ඒකක 1,370 කි.

ඉවත දැමූ ඒකක පහත සඳහන් පරිදි නිමවී තිබුණි.

අමුද්‍රව්‍ය	90%
ශ්‍රමය	80%
පොදුකාර්ය	80%

ඉවත දමන ලද ඒකකයක් රු. 2.00 ක් ගණනේ විකිණිය හැක. මාසය තුළදී ඒකක 12,630 ක් නිමවූ තොගයට යවන ලදී. මාසයේ වියදම් මෙසේය.

අමුද්‍රව්‍ය	26,300
ශ්‍රමය	14,355
පොදුකාර්ය	40,455

අවසාන තොගය ඒකක 1,500 කි. අවසාන තොගයේ ඒකකයක් පහත සඳහන් පරිදි නිමවී තිබුණි.

අමුද්‍රව්‍ය	60%
ශ්‍රමය	50%
පොදුකාර්ය	50%

ක්‍රියාවලියේ සාමාන්‍ය අපතේ යාම 10%

ක්‍රියාවලියේ ගිණුම් සකස් කරන්න.

ප්‍රශ්න අංක 03

"කේ" භාණ්ඩය පිළිබඳ මාර්තු මාසයේ විස්තර මෙසේය.

මාසයේ ආරම්භයේදී කෙරීගෙන යන ඒකක 1,500 කි. පිරිවැය රු. 9,450 කි. මෙම තොගය පහත සඳහන් පරිදි නිම වී තිබුණි.

අමුද්‍රව්‍ය	60%
ශ්‍රමය	50%
පොදුකාර්ය	50%

මාර්තු මාසයේදී ක්‍රියාවලියට ඇතුලත් කළ ඒකක 16,500 කි.

පිරිවැය රු. 48,000

ඉවත දැමූ ඒකක 1,550 කි. ඉවත දැමූ ඒකක පහත සඳහන් පරිදි නිම වී තිබුණි.

අමුද්‍රව්‍ය	80%
ශ්‍රමය	70%
පොදුකාර්ය	70%

ඉවතදමන ඒකකයක් රු. 2.00 ගණනේ විකිණිය හැක. මාසයක් තුළදී ඒකක 13,450 ක් නිමි භාණ්ඩ තොගයට මාරුකරන ලදී. මාසයේ වියදම් මෙසේය.

අමුද්‍රව්‍ය	රු. 30,849
ශ්‍රමය	රු. 13,081.50
පොදුකාර්ය	රු. 56,686.50

අවසාන තොගය ඒකක 3,000 ක් විය. අවසාන තොගයේ ඒකකයක් පහත සඳහන් පරිදි නිමවී තිබිණි.

අමුද්‍රව්‍ය	70%
ශ්‍රමය	60%
පොදුකාර්ය	60%
ක්‍රියාවලියේ සාමාන්‍ය අපතේ යාම	10%

ක්‍රියාවලියේ ගිණුම් සකස් කරන්න.

ප්‍රශ්න අංක 04
එක්තරා මාසයක අංක 3 ක්‍රියාවලිය පිළිබඳ විස්තර මෙසේය.

ආරම්භක ඒකක		1,000	
එහි වටිනාකම			
	සෘජු ද්‍රව්‍ය	1	390
	සෘජු ද්‍රව්‍ය	11	75
	සෘජු ශ්‍රමය		112
	පොදුකාර්ය		118
			695

අංක 02 ක්‍රියාවලියෙන් ලැබීම් ඒකක 6,000		රු. 2,360
අංක 04 ක්‍රියාවලියට යැවීම් ඒකක 4,700		
අංක 03 ක්‍රියාවලියේදී එකතු කළ සෘජු ද්‍රව්‍ය 11		520
	ශ්‍රමය	1,036
	පොදුකාර්ය	1,541

ඉවත දැමූ ඒකක 300 එම ඒකක පහත සඳහන් පරිදි නිම වී තිබුණි.

සෘජු ද්‍රව්‍ය	100%
සෘජු ශ්‍රමය	80%
පොදුකාර්ය	60%

අවසන් තොගය ඒකක 2,000 ක් වූ අතර එම ඒකක පහත සඳහන් පරිදි අවසන් වී තිබිණි.

සෘජු ද්‍රව්‍ය	60%
සෘජු ශ්‍රමය	50%
පොදුකාර්ය	40%

සාමාන්‍ය අපතේ යෑම 5% ක් වන අතර එම ඒකකයක් රු. 0.20 ගණනේ විකිණිය හැක. නිෂ්පාදනයට අවශ්‍ය තොග නිකුත් කරන්නේ සාමාන්‍ය මිල මතය.

ගිණුම් සකස් කරන්න.

ප්‍රශ්න අංක 05
නිෂ්පාදන අංක 02 ක්‍රියාවලිය හා සම්බන්ධ විස්තර මෙසේය.

ආරම්භක තොගය ඒකක 600 පිරිවැය රු. 105

ආරම්භක තොගය පහත සඳහන් පරිදි අවසන් වී ඇත.

සෘජු ද්‍රව්‍ය	50%
සෘජු ශ්‍රමය	60%
පොදුකාර්ය	60%

අංක 1 ක්‍රියාවලියෙන් යොමු කළ ඒකක 11,000 පිරිවැය 550
අංක 3 ක්‍රියාවලියට යොමුකළ ඒකක 8,800

අංක 2 ක්‍රියාවලියේදී පහත සඳහන් වියදම් දරා ඇත.

සෘජු ද්‍රව්‍ය	245.50
සෘජු ශ්‍රමය	715.50
පොදුකාර්ය	954

ඉවත දැමූ ඒකක 1,200 ක් වූ අතර එම එක් ඒකකයක් පහත සඳහන් පරිදි නිම වී තිබිණි.

සෘජු ද්‍රව්‍ය	100%
ශ්‍රමය	70%
පොදුකාර්ය	70%

අවසන් කෙරීගෙන යන බඩු තොග ඒකක 1,600 කි. එම ඒකකයක් පහත සඳහන් පරිදි නිම වී තිබේ.

සෘජු ද්‍රව්‍ය	70%
සෘජු ශ්‍රමය	60%
පොදුකාර්ය	60%

මෙම ක්‍රියාවලියේ සාමාන්‍ය අපතේ යාම 10% කි. අපතේ යන ඒකකයක් රු. 0.05 ගණනේ විකුණාගත හැක. ගිණුම් පිළියෙල කළ හැක්කේ කලින් ලැබීම්, කලින් ක්‍රමය මතය.

ගිණුම් සකස් කරන්න.

ප්‍රශ්න අංක 06

සමාගමක් බද්ධ නිෂ්පාදන තුනක් සහ එක් අතුරු නිෂ්පාදනයක් සකස් කරයි. සියලුම භාණ්ඩ අඩක් සකස් කිරීමෙන් පසුවද අලෙවි කරගත හැකිය. විස්තර මෙසේය.

භාණ්ඩය		නිෂ්පාදන ප්‍රතිශතය	අවසාන විකුණුම් මිල	අතරතුර විකුණුම් මිල	අතිරේක පිරිපහදු වියදම්
බද්ධ නිෂ්පාදන	A	40%	57	38	14
එම	B	30%	43	24	10
එම	C	20%	83	30	36
අතුරු නිෂ්පාදන	D	10%	25	12	16

කුමන තත්ත්වයෙන් අලෙවි කළද මෙම භාණ්ඩ අලෙවි කිරීමට පෙර භාජනයක දැමිය යුතුය. සම්පූර්ණයෙන්ම සකස් කළ භාණ්ඩ ඒකකයක් සඳහා අවශ්‍ය භාජනයේ මිල රු. 3 කි. අඩක් සකස් කළ භාණ්ඩ ඒකකයක් සඳහා අවශ්‍ය භාජනයක මිල රු. 2 කි. පසුගිය මාසයේ වියදම්,

අමුද්‍රව්‍ය කිලෝවක් රු. 8 ගණනේ කිලෝ 100,000 කි.
ශ්‍රම පැයකට රු. 2.50 ක් ගණනේ පැය 85,000 කි.
ස්ථාවර පොදුකාර්ය රු. 2,000,000

එක් එක් භාණ්ඩයේ ඒකකයක සහභාගය සහ පසුගිය මාසයේ ශුද්ධ ලාභය ගණනය කරන්න.

ප්‍රශ්න අංක 07

සමාගමක් පිළිවෙලින් ඒඒ බීබී සහ සීසී නමින් හඳුන්වන බද්ධ නිෂ්පාදන දෙකක් සහ අතුරු නිෂ්පාදනයක් සකස් කරයි.

පෙරසැරි විස්තර පහත සඳහන් පරිදිය.

<u>පළමු පෙරසැරිය</u>

දියර දෙකක් වන ඒ සහ බී 4 : 1 අනුපාතයට මිශ්‍ර කෙරේ. මිශ්‍ර කිරීමේ සාමාන්‍ය අපතය 10% කි. නිෂ්පාදනයන් මෙසේ වෙන්කර ගනු ලැබේ.

50% ක් සකස් කළ අංක 1 දියරය ලෙස
40% සකස් කළ අංක 11 දියරය ලෙස
10% අතුරු නිෂ්පාදනය ලෙස
සකස් කළ දියර දෙවැනි පෙරසැරියට මාරු කෙරේ.

<u>දෙවන පෙරසැරිය</u>

සකස් කළ අංක 1 දියරය සමග "C" දියරය 3 : 1 අනුපාතයට මිශ්‍ර කිරීමෙන් ඒඒ නිෂ්පාදනය සකස් කෙරේ.

සකස් කළ අංක 11 දියරය සමග "D" දියරය 4 : 1 අනුපාතයට මිශ්‍ර කිරීමෙන් බීබී නිෂ්පාදනය සකස් කෙරේ.

දියර ලීටරයක මිල

ඒ - රු. 4.00	බී - රු. 2.00
සී - රු. 5.00	ඩී - රු. 6.00

පෙරසැරියට යොමුකළ දියර ලීටරයක් පිරිපහදු කිරීමේ පිරිවැය

අංක 1 පෙරසැරියට	රු. 2.50
අංක 11 පෙරසැරියට	රු. 3.00

හිස් භාජනයක මිල

ඒඒ	රු. 2.00
බීබී	රු. 1.50
සීසී	රු. 0.50

පසුගිය සතියේ සීසී නිෂ්පාදනය ලීටර් 810 විය. සීසී ලීටරයක් රු. 16.50 ගණනේ විකුණන ලදී.

නිෂ්පාදන ලීටරයක පිරිවැය කිට්ටුම සතයට ගණනය කරන්න.